# කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳ රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු වාර්තාව

මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ශ්‍රී ලංකා රජය

2023 සැප්තැම්බර් මස

**පටුන**


පසුබිම 01

කෘෂිකර්ම අමාත්‍යාංශයේ රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු වාර්තාව 01
සඳහා ක්‍රියාරාමුව

හැඳින්වීම 02

රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුවේ විශ්ලේෂණ 03

1. දැක්ම, මෙහෙවර සහ මූලික ක්‍රියාකාරකම් අමාත්‍යාංශයේ විෂයපථයට අනුකූලභාවය 03
තහවුරු කර ගැනීම

2. රේඛීය අමාත්‍යාංශයේ සියලු වැඩසටහන්/ව්‍යාපෘති/උප - ව්‍යාපෘති/ ක්‍රියාකාරකම් 04
සමාලෝචනය කරමින් අමාත්‍යාංශයේ අරමුණු, මෙහෙවර, දැක්ම සාක්ෂාත් කර ගැනීම
වෙනුවෙන් ඒවායේ දායකත්වය හඳුනා ගැනීම

3. අනුමත අයවැය ඇස්තමේන්තුවල පවත්නා ද්වීකරණ සහිත, අත්‍යවශ්‍ය 11
නොවන සහ අවම ප්‍රමුඛතා සහිත ව්‍යාපෘති හෝ වියදම් හඳුනා ගැනීම

4. අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල අවශ්‍යතාවන් සාධාරණීයකරණය 12
කරමින් ක්‍රියාත්මක ප්‍රමුඛ හා මූලික ව්‍යාපෘති තුනක්වත් අවම වශයෙන්
හඳුනා ගැනීම හා ඒවයෙහි සාධාරණීයකරණය සොයා බැලීම

5. ප්‍රශස්ත ලෙස සම්පත් භාවිතය සහතික කිරීම සඳහා කාර්යක්ෂම 14
හා ඵලදායි ක්‍රියාපටිපාටි සහ පිරිවැය සංරචක හඳුනා ගැනීම

6. කෘෂිකර්ම අමාත්‍යාංශයේ වගකීම් ඉටු කිරීම සඳහා වන ප්‍රතිසංස්කරණ 15
අරමුණු, රාමුව සහ "නිසි පිරිවැය - නිසි කලට" ආකෘතිය තුළ රජයේ
අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීම

ඇමුණුම්

ඇමුණුම් 01 – රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුවේ සංයුතිය 21

ඇමුණුම් 02 – රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව සඳහා වන නියමයන් 21

ඇමුණුම් 03 – එකඟතාව සහිත සම්මුතිය 22

ඇමුණුම් 04 – සමාලෝචන ක්‍රමවේදය 22

ඇමුණුම් 05 – වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ වියදම් ඒකක සමාලෝචනය 23

ඇමුණුම් 06 – රැකියා විස්තර 36

ඇමුණුම් 07 – කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෙටුම්පත් කර ඇති ප්‍රතිඵලදායක ක්‍රියාරාමුව 37

## පසුබිම

රාජ්‍ය මූල්‍ය සුරක්ෂිතභාවය ගොඩනැංවීමට හා ගුණාත්මක ලෙස ආංශික වියදම් දැරීම පිළිබඳ සාක්ෂි සැපයීම සඳහා රාජ්‍ය ප්‍රතිපත්තිමය අරමුණුවලට සාපේක්ෂව දීර්ඝකාලීනව සිදුකරන ලද රජයේ වියදම් සහ අදාළ කාර්යසාධන දර්ශකවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක විග්‍රහයන් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින් රාජ්‍ය වියදම් සමාලෝචනයක් (PER) මගින් මුදල් අමාත්‍යාංශය සහ අනෙකුත් අදාළ රේඛීය අමාත්‍යාංශ අතර ආංශික ප්‍රමුඛතා, ප්‍රතිපාදන, වියදම් කාර්යක්ෂමතාවය, ක්‍රියාත්මක කිරීමේ ධාරිතාව සහ ප්‍රතිඵල ඇගයීම පිළිබඳව ප්‍රයෝජනවත් සංවාදයක් ගොඩ නැංවීමට හැකි වේ. ප්‍රශස්ත රාජ්‍ය මූල්‍ය කළමනාකරණයක් කෙරෙහි එවැනි විවේචනාත්මක සමාලෝචන ඉවහල් වන අතර රාජ්‍ය වියදම්වල කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය ඉහළ නැංවීමේ අරමුණින් රජයේ සෑම මට්ටමක ම කාර්ය සාධනය පදනම් කරගත් ප්‍රතිසංස්කරණ කෙරෙහි එම සමාලෝචන පිටුවහලක් වනු ඇත.

එම වැදගත්කම අවබෝධ කර ගනිමින්, 2023 පෙබරවාරි 06 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ අංක 23/0256/604/030 දරන තීරණය මත පදනම්ව ශූන්‍ය පාදක අයවැයකරණයේ මූලධර්මවලට අනුකූලව ක්‍රමානුකූල සමාලෝචනයක් හරහා එහි වියදම් තාර්කික කිරීම සහ රාජ්‍ය වියදම්වල අනාගත කාර්ය සාධනය පදනම් කරගත් ප්‍රතිසංස්කරණවලට මාර්ගෝපදේශ සැපයීම සඳහා අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශය **(MoA)** සඳහා වන රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව **(PERC)** පිහිටුවා ඇත (ඇමුණුම1).

**PERC** වෙත නිකුත් කරන ලද යොමු නියමයන් (ඇමුණුම 2) මගින් පහත වගකීම් පවරා ඇත:

- දැක්ම මෙහෙවර සහ මූලික ක්‍රියාකාරකම් අමාත්‍යාංශයේ විෂය පථයට අනුකූලද යන්න සහතික වීම.
- රේඛීය අමාත්‍යාංශයේ සියලුම වැඩසටහන්/ව්‍යාපෘති/උප ව්‍යාපෘති/ක්‍රියාකාරකම් සමාලෝචනය කර අමාත්‍යාංශයේ අරමුණු, මෙහෙවර සහ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ඒවායින් දායකත්වය සපයන ආකාරය හඳුනාගැනීම.
- කෘෂිකර්ම අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ වත්මන් වැය වැඩසටහන්වල ද්විකරණය, නාස්තිය සහ අඩු ප්‍රමුඛතාවය සහිත ව්‍යාපෘති හෝ වියදම් හඳුනාගැනීම.
- අවශ්‍යතාවය සාධාරණීකරණය කරමින් ප්‍රමුඛතා ව්‍යාපෘති හඳුනා ගැනීම.
- ප්‍රශස්ත සම්පත් භාවිතය සහතික කිරීම සඳහා කාර්යක්ෂම හා ඵලදායී ක්‍රියා පටිපාටි සහ පිරිවැය සාධක හඳුනා ගැනීම.

- කෘෂිකර්ම අමාත්‍යාංශයට සිය වගකීම් ඉටු කළ හැකි වන පරිදි "නිසි පිරිවැය-නිසි කලට" ආකාරයෙන් රජයේ අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කරගත හැකි වන ආකාරයේ ප්‍රතිසංස්කරණ සහ රාමුව යෝජනා කිරීම.

## රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව සහ කෘෂිකර්ම අමාත්‍යාංශය (PERC – MOA) සඳහා රාමුව

PERC - MOA කමිටුව එකඟ වූ කෙටුම්පත් ලේඛනයට සහ පටිපාටීන්ට (ඇමුණුම 3) අනුව කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශ විෂය සීමාව යටතේ ඇති රේඛීය දෙපාර්තමේන්තු/ආයතනවල නිලධාරීන් සමඟ රැස්වීම් කිහිපයක් පවත්වනු ලැබිණි. ජාතික ක්‍රමසම්පාදන, ජාතික අයවැය සහ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ යන දෙපාර්තමේන්තුවල නිලධාරීන්ද මෙම රැස්වීම් සඳහා සහභාගී වී, පැවරුණු කාර්යයභාරය, වත්මන් කාර්ය විෂය පථය, අනාගත වගකීම් සහ අභියෝග, අවශ්‍ය වැඩිදියුණු කිරීම් සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ විවේචනාත්මක නිරීක්ෂණ ඉදිරිපත් කළ අතර, විෂය සීමාව යටතේ ඇති දෙපාර්තමේන්තු/ආයතන විසින් අවශ්‍ය වැඩි දියුණු කිරීම් සඳහා වන ඉදිරිපත් කිරීම් හා අධ්‍යනයන් ලබා දෙන ලදි.

## හැඳින්වීම

ආහාර සුරක්ෂිතතාව තහවුරු කරමින් ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් සපයන කාෂිකාර්මික අංශය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික බලවේගයක් බවට පත්ව තිබේ. එමෙන්ම කෘෂිකර්මාන්තය ග්‍රාමීය අංශයේ බහුතරයකගේ ජීවනෝපාය වන අතර ග්‍රාමීය දිළිඳුකම පිටුදැකීමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. 2022 දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය 7.8% කින් හැකිළී ගිය අතර මෑතකාලීන ආර්ථික පසුබෑමේ ප්‍රතිඵලයක් ලෙස කෘෂිකර්ම අංශය ද 4.6% කින් හැකිළී ගිය නමුත්, සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් 8.7% කට දායක විය. 1948 නිදහස ලැබූ කාලයේ සිටම මෙම ක්ෂේත්‍රයේ වැදගත්කම හොඳින් හඳුනාගෙන ඇති අතර, එතැන් සිට පැවති සෑම රජයක් විසින්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා කැබිනට් අමාත්‍යධූරයක් වෙන් කර තිබේ.

ගොවි පවුල් මිලියන 1.8ක මෙන්ම කෘෂි ආහාර අගය දාමයේ පාර්ශවකරුවන්ගේද වගකීම කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත පැවරේ. කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සැකසීම, නියාමනය සහ අවශ්‍ය මාර්ගෝපදේශ සැපයීම සහ ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය සඳහා එහි ප්‍රධාන යාන්ත්‍රණයන් තුන වන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (DOA), ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව (DAD), සහ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව (DAPH) සමඟ සහයෝගයෙන් එහි අනිවාර්ය කාර්යයන් මනාව ක්‍රියාත්මක කිරීම කෘෂිකර්ම අමාත්‍යාංශයට භාර ව ඇති අතර, එම ආයතනය ඒ සඳහා කැපවී සිටී. ගැසට් පත්‍රයේ පළ කර ඇති පරිදි, මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් පහත පරිදි ලැයිස්තු ගත කළ හැක.

1. කෘෂිකර්මාන්තය, පශු සම්පත් හා කිරි යන නිෂ්පාදන වැඩි දියුණු කිරීම හා ඵලදායිතාව කිරීම.

2. පෙර සහ පසු අස්වනු හානි අවම කිරීම

3. අවදානම්, කම්පන, තර්ජන සහ අවිනිශ්චිතතා කළමනාකරණය කිරීම

4. අගය දාමය සහ තරඟකාරිත්වය ශක්තිමත් කිරීම

5. ගොවීන් සවිබල ගැන්වීම හා ව්‍යවසායකත්ව සංවර්ධනය

6. බීජ සහතික කිරීම සහ පැළෑටි සංරක්ෂණය

7. කෘෂිකාර්මික අංශය දියුණු කිරීම සඳහා යටිතල පහසුකම් සැපයීම

ලබා දී ඇති කාර්යය ඉටු කිරීම සඳහා 28,000 කට ආසන්න කාර්ය මණ්ඩලයක් ජාතික මට්ටමින් කාර්යයන්හි නිරතව සිටී. ප්‍රධාන වශයෙන් පළාත් සභා යටතේ පළාත් මට්ටමින් ක්‍රියාත්මක වන බලය පැවරුණු විෂයක් වන කෘෂිකර්ම ව්‍යාප්ති සේවා ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ පළාත් කාර්ය මණ්ඩලය මෙම සංඛ්‍යාවට ඇතුළත් නොවේ. මහා පරිමාණ, විශාල හා මධ්‍ය පරිමාණ සංවර්ධන ව්‍යාපෘති 124ක් මෙන්ම ඵලදායිතාව ඉහළ නැංවීම, කෘෂිකාර්මික නවීකරණය, ආහාර පද්ධති ශක්තිමත් කිරීම සහ කෘෂිකාර්මික අගය දාමයන් ශක්තිමත් කිරීම මුදල් ප්‍රදාන සහ ද්‍රව්‍යමය ආධාර හරහා සවිබල ගැන්වීම, ශක්‍යතා ගොඩනැංවීම, යටිතල පහසුකම් සංවර්ධනය තුළින් ගොවීන් සවිබල ගැන්වීම යනාදී ක්ෂේත්‍රවල වැඩසටහන් හරහා රජය විසින් දළ වශයෙන් රුපියල් බිලියන 294ක ආයෝජනයක් 2015 වසරේ සිට සිදු කර ඇත.

---

[1] ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2023): වාර්ෂික වාර්තාව 2022. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/Reports/2022_Annual_Provisional

මෙම ආයෝජනයෙන් රුපියල් බිලියන 91 ක් ලබාගෙන ඇත්තේ ප්‍රධාන වශයෙන් ණයවලින් වන අතර, මෙම ණය ආපසු ගෙවීමේ දී එහි පොළිය සහ බොහෝ අවස්ථාවල දී ප්‍රමාද වීම හේතුවෙන් එකතු වන කැපවීම් ගාස්තු ද දැරීමට සිදුවේ. තවද, රසායනික පොහොර (උදා: යූරියා, ත්‍රිත්ව සුපර් පොස්පේට් (TSP), මියුරේට් ඔෆ් පොටෑෂ් (MOP) වැනි කෘෂිකාර්මික යෙදවුම් විශාල ප්‍රමාණයක් සහ ව්‍යාප්ති සේවා සමඟින් ද්‍රව්‍යමය ආධාර සැපයීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන්ගේ සහයෝගය ද පසුගිය කාලය තුළ ලැබී ඇත.

## PERC විශ්ලේෂණය

රැස්වීම ආරම්භයේදී සකස් කරන ලද කෙටුම්පත් ලේඛනයන්ට අනුව, PERC කමිටුව කෘෂිකර්ම අමාත්‍යාංශයට, අනෙක් අංශ වලට සාපේක්ෂව ඇති ප්‍රධාන ශක්තීන් පිළිබඳව සාකච්ඡා කරන ලදී. ඒ අනුව, අනෙකුත් අංශවලට සාපේක්ෂව කෘෂිකාර්මික අංශය සඳහා වාර්ෂික අයවැය ප්‍රතිපාදන වෙන්කිරීමේදී ඉහළ ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කෙරේ. තවද, විශේෂඥ දැනුම සහිත සැලකිය යුතු මානව සම්පතක් සමඟ කාර්ය මණ්ඩලය විශාල සංඛ්‍යාවක් රට පුරා ව්‍යාප්තව ඇත. ව්‍යාප්ති සේවා සැපයීම සඳහා ශක්තිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කර ඇත. විෂයට අදාලව කේන්ද්‍රියව සහ විසිරි මට්ටමින් සමාන්තරව රාජ්‍ය පරිපාලනය යාන්ත්‍රණය ක්‍රියාත්මක කෙරේ. පර්යේෂණ සහ සංවර්ධන (R&D) සඳහා ප්‍රමාණාත්මකව ඉහළ ආයෝජන සිදු කරනු ලබන අතර, අමාත්‍යාංශයේ මූලික කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍යාංශය සතු පර්යේෂණ සහ සංවර්ධන සඳහා ආධාරක ආයතනික ව්‍යුහය සහ මහා පරිමාණ විදේශ මූල්‍ය ව්‍යාපෘති සමගාමීව ක්‍රියාත්මක වන අතර අවසාන වශයෙන්, මෙම ක්ෂේත්‍රයට ඉහළම ප්‍රමුඛතාවයක් ලබා දී ඇති බැවින් අවශ්‍ය අවස්ථාවලදී රජයේ කඩිනම් මැදිහත්වීම ලබාදීමද සිදුකෙරේ.

## (1) දැක්ම, මෙහෙවර සහ මූලික ක්‍රියාකාරකම් අමාත්‍යාංශයේ කාර්යභාරයට අනුකූලදැයි නිශ්චය කිරීම

ගැසට් නිවේදනයෙන් ප්‍රතිෂ්ඨාපිත කාර්යභාරයට අනුව කෘෂිකාර්මික පුනර්ජීවනය තුළින් ස්වයංපෝෂිත වීමට පහසුකම් සැලසීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය පිහිටුවා ඇත. දේශීය නිෂ්පාදනය මගින් ආහාර සුරක්ෂිතභාවය ළඟා කර ගැනීම සහ ආහාර ආනයන වියදම් අවම කර ගැනීමේ අරමුණින් දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ

නැංවීමට කටයුතු කර ඇත. ඒ අනුව, ආහාර සහ ආහාර භෝග සහ පශු සම්පත් නිෂ්පාදනය පැවැත්ම සහතික කිරීම අනිවාර්ය වේ.

කමිටුව කෘෂිකර්ම අමාත්‍යාංශයේ (MoA) දැක්ම සමාලෝචනය කළ අතර, එය ආහාර සුරක්ෂිතතාව සහ ජාතික සමෘද්ධිය පිළිබඳ ප්‍රතිපත්තිමය අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඇති කැපවීම පෙන්නුම් කරන බව එම කමිටුවේ අදහස විය.

### *ආහාර සුරක්ෂිතතාව සහ ජාතික සමෘද්ධිය සඳහා කාර්යක්ෂම, ඵලදායී සහ ශක්තිමත් කෘෂිකාර්මික අංශයක් ගොඩනැගීම*

එබැවින් පවතින දැක්ම වෙනස් කිරීමකින් තොරව පිළිගැනීමට කමිටුව එකඟ වේ. කෙසේ වෙතත්, ගිවිසගත් ප්‍රතිපත්ති ඉලක්ක 12ක් සමඟින් සකස් කර ඇති ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්ති කෙටුම්පත අමාත්‍යාංශයේ දැක්මට සම්බන්ධ කර ඇති නමුත් ඉන් පශු සම්පත් අංශය ආවරණය නොවන බව නිරීක්ෂණය කළ අතර ප්‍රතිපත්ති ආවරණය මගින් අමාත්‍යාශයේ සමස්ත කාර්යභාරයම ආවරණය විය යුතු බව කමිටුවේ අදහස විය.

කමිටුව අමාත්‍යාංශයේ "මෙහෙවර" සමාලෝචනය කළ අතර එමගින් එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා උපාය මාර්ගික දිශාව ප්‍රමාණවත් ලෙස පිළිබිඹු නොකරන බව නිරීක්ෂණය කරන ලදී.

> ***ස්වභාවික සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීම තුළින් පොදුවේ පිළිගත හැකි සහ වාණිජමය දිශානතියක් සහිත ලොව පුරා තරඟකාරී නිෂ්පාදනයක් සිදු කරන ව්‍යවසායී කෘෂිකර්මයක් සාක්ෂාත් කර ගැනීම***.

දැක්ම යටතේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ අභියෝගවලට මුහුණදීම සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග සමඟ මෙහෙවර ප්‍රකාශය අනුගතවී නොමැති බැවින්, අමාත්‍යාංශයේ කාර්යයන් අනුව අර්ථ දක්වා ඇති ප්‍රධාන උපායමාර්ගික / බල ක්ෂේත්‍ර(Thrust area) සමඟින් "මෙහෙවර" ප්‍රකාශය සමාලෝචනය කිරීමට කමිටුව යෝජනා කරයි.

අමාත්‍යාංශය විසින් මෙම වාර්තාවේ අවසන් නිමැවුම් ලබාදීම එකඟ වූ සන්ධිස්ථාන අනුව (අ) ව්‍යාපෘති සම්බන්ධ, සහ (ආ) වාර්ෂික වැඩසටහන් හා සම්බන්ධ යනුවෙන් දෙයාකාර වේ. අයවැය ප්‍රතිපාදන මත පදනම්ව සකස් කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව අමාත්‍යාංශය ක්‍රියාත්මක වන නමුත්, වියදම් අයිතම අනුව කාර්තුමය වශයෙන් ප්‍රගතිය සමාලෝචනය කර ඇත. සෑම මහා පරිමාණ ව්‍යාපෘතියකටම වෙනම ප්‍රතිඵල රාමුවක් සකස් කර ඇතත්, ඒවායේ ක්‍රියාකාරීත්වය එකසේ කාර්යසාධනය, කාර්යසාධන දර්ශකය (KPI) මත පදනම්ව සමාලෝචනය නොකෙරේ. එබැවින් අතිවිශාල ජයග්‍රහණයක් පෙන්නුම් නොකෙරේ. සමහර වාර්ෂික වැඩසටහන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ කාර්ය භාරය වනුයේ පර්යන්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අරමුදල් මාරු කිරීමක් පමණක් වන බැවින් වසර අවසන් වනතුරු එම කටයුතුවල භෞතික ප්‍රගතිය නිරීක්ෂණය කළ නොහැක. මෙවැනි

භාවිතයන් නිසා සැලසුම්කල ප්‍රතිඵල ලබාදීමේ අඛණ්ඩ ප්‍රමාදයන් ඇති වී ඇති බව කමිටුව නිරීක්ෂණය කළේය.

එබැවින්, අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් සඳහා සන්ධිස්ථානයන් සමඟ ප්‍රධාන කාර්ය සාධන දර්ශක ඇතුළත් ප්‍රතිඵල රාමුවක් සකස්කර ඊට අනුගතව ක්‍රියා කිරීමට කමිටුව යෝජනා කරයි.

**(**2) **රේඛීය අමාත්‍යාංශයේ සියලුම වැඩසටහන්/ව්‍යාපෘති/උප ව්‍යාපෘති/ක්‍රියාකාරකම් සමාලෝචනය කර අමාත්‍යාංශයේ අරමුණු, මෙහෙවර සහ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ඒවා දායකත්වය සපයන ආකාරය හඳුනා ගැනීම.**

2023 වර්ෂය සඳහා වන අයවැය ඇස්තමේන්තුවලට අනුව, රජය කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ එහි දෙපාර්තමේන්තු සඳහා දළ වශයෙන් රුපියල් බිලියන 115 ක් වෙන්කර ඇති අතර එය සමස්ත වාර්ෂික අයවැයෙන් 2.8% කි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ අයවැය ප්‍රාග්ධන ආයෝජනයට වඩා තාක්ෂණික මෙහෙයුම් කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වයි. සමස්ත අයවැයෙන් 70% ක් පමණ පුනරාවර්තන ස්වභාවයේ ක්‍රියාකාරකම් සඳහා වෙන්කරනු ලබන අතර

වැඩි කොටසක් පොහොර සඳහා වන වියදම් දැරීමට වැයවේ. තවද, බීජ බෙදා හැරීම, කෘෂිකාර්මික පළිබෝධ, මෙවලම් වැනි පුනරාවර්තන ස්වාභාවයේ ක්‍රියාකාරකම් සඳහා ප්‍රාදේශීය මට්ටමින් විශාල අරමුදල් ප්‍රමාණයක් වෙන් කර ඇත. ප්‍රාග්ධන අයවැයෙන් ගොවීන් වෙත සැලකිය යුතු ප්‍රදාන ප්‍රමාණයක්ද ලබා දේ.

**වගුව 1**: **කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ එහි දෙපාර්තමේන්තුවල** 2023 **වසර සඳහා අනුමත අයවැය**

| **ආයතනය** | **අනුමත අයවැය** 2023 (LKR’ 000) | | | **ප්‍රාග්ධනය: පුනරාවර්තන අනුපාතය** |
|---|---|---|---|---|
| | **පුනරාවර්තන** | **ප්‍රාග්ධනය** | **එකතුව** | |
| කෘෂිකර්ම අමාත්‍යාංශය | 58,577,136 | 22,141,500 | 80,718,636 | 1:2.6 |

| | | | | |
|---|---|---|---|---|
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 9,659,750 | 4,520,000 | 14,179,750 | 1:2.1 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 6,319,014 | 3,380,500 | 9,699,514 | 1:1.8 |
| සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | 802,100 | 867,000 | 1,669,100 | 1:0.9 |
| අනෙකුත් ආයතන | 5,642,000 | 3,466,000 | 9,108,000 | 1:1.6 |
| එකතුව | **81,000,000** | **34,370,000** | **115,370,000** | **1:2.3** |

PERC හි TOR (යොමු නියමයන්) හි නිශ්චිතව දක්වා ඇති කාර්යයන් 12 මත පදනම්ව, කමිටුව විසින් සමාලෝචන ක්‍රමවේදයක් ස්ථාපිත කර ඇත (ඇමුණුම 4). කෘෂිකර්ම අමාත්‍යංශයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුගත මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති පහක් සහ මහා පරිමාණ පුනරාවර්තන වැඩසටහනක් ඇතුළුව ප්‍රධාන වියදම් අයිතම 38ක් කමිටුව විසින් අදාළ ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් සහ රේඛීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් සමඟ සමාලෝචනය කරන ලදී (ඇමුණුම 5). 2 වගුවේ හඳුනාගෙන ඇති ප්‍රධාන කොටස් අට, ස්වභාවය සහ කාර්යයේ විෂය පථයේ සමානකම් මත පදනම්ව වර්ගීකරණය කරන ලද අතර ඒවා සමාලෝචනයේදී සලකා බලන ලදී. බල ක්ෂේත්‍ර හරහා කෘෂිකර්ම අමාත්‍යංශයහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා එක් එක් සංරචකවල දායකත්වය තවදුරටත් විශ්ලේෂණය කරන ලදී. තවද, සමස්ත කෘෂිකර්ම අමාත්‍යංශයේ අයවැය මත එක් එක් සංරචකවල වැදගත්කමද අවබෝධ කරනු ලැබේ. දැක්ම, පවත්නා අභියෝග සහ වත්මන් ආර්ථික අර්බුදය හේතුවෙන් මතුවන සංකීර්ණ තත්ත්වයන්, සමාජයට ලැබෙන ප්‍රතිලාභ, ප්‍රතිඵල-ලැබීමේ කාලසීමාව, වෙළඳපළ පැවතීමේ හැකියාව, ආනයන සීමා කිරීම් සහ රජයේ ප්‍රමුඛතා වැනි පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා මෑත කාලීන ප්‍රතිපත්ති වෙනස්වීම්/ ඉදිරිදැක්ම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් කමිටුව විසින් සෑම ව්‍යාපෘතියක් සඳහාම සිය නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී. මෙම විශ්ලේෂණය මගින් හඳුනාගත් එක් එක් සංරචක යටතේ ඇති ඉතුරුම් විභවතාවය වගුව 2 හි දක්වා ඇත.

| **වගුව** 2: **කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති සංරචකවල සාරාංශ විශ්ලේෂණය** | | | |
|---|---|---|---|
| **සංරචකය** | **ප්‍රධාන කාර්යයන්ට ඇති සම්බන්ධය** | 2023 **අයවැයේ කොටස** | **විභව ඉතුරුම්** (**රු. මිලියන**) |
| පොහොර සැපයීම | 1 | 49% | 5,309 |
| මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති | 1, 2, 3, 4,7 | 16% | - |
| බීජ සහතික කිරීම සහ පැළෑටි සංරක්ෂණය | 1, 6 | 2% | 500 |
| ආහාර සුරක්ෂිතතා වැඩසටහන | 1, 2, 3, 4, 5, 6 | 4.5% | 50 |
| පශුසම්පත් සංවර්ධනය සහ කිරි නිෂ්පාදනය | 1 | 0.3% | 191.5 |
| විශ්‍රාම වැටුප් සහ රක්ෂණය | 3 | 5% | - |
| පර්යේෂණ සහ සංවර්ධනය | 1, 2, 5 | 1% | 43 |
| ආයතනික සංවර්ධනය සහ පරිපාලනය | 0 | 20.5% | 280 |

### i. පොහොර සැපයීම

රටේ වාර්ෂික පුනරාවර්තන අයවැයමත විශාල මූල්‍ය පීඩනයක් එල්ල කළත්, ආහාර සුරක්ෂිතතාව සාක්ෂාත් කර ගැනීමේදී කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා පොහොර සැපයීම තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. එබැවින්, (අ) සහනාධාර ලබා දීම, (ආ) පරීක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම, (ඇ) දත්ත ගබඩාවක් සංවර්ධනය කිරීම සහ (ඈ) පොහොර ගබඩා වැඩිදියුණු කිරීම මෙන්ම (ඉ) ණය ගෙවීම යන අරමුණින් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් පොහොර වැඩසටහනට අදාළ අයවැය වැය විෂය පහක් වෙන් කර ඇත. *2023* ජාතික අයවැයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා වෙන් කර ඇති මුළු ප්‍රතිපාදනවලින් අඩකට ආසන්න ප්‍රමාණයක් පොහොර සහනාධාර ප්‍රතිපාදන ලෙස විශාලතම (රුපියල් බිලියන *56)* වෙන් කිරීම වේ. මෙම ප්‍රතිපාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් (රු. බිලියන *43.6)* පූර්ව වගකීම් නිරවුල් කිරීම සඳහා වීම විශේෂත්වයකි. සහනාධාර පිරිවැයෙන් සැලකිය යුතු ප්‍රමාණයක්, එනම් සමස්ත පොහොර සහනාධාර ප්‍රතිපාදනවලින් ආසන්න වශයෙන් 1/5ක් එහි මෙහෙයුම් වියදම් සඳහා වන බව කමිටුව විසින් නිරීක්ෂණය කරනු ලැබිණි. තිරසාර ගොවිතැන් පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩි දියුණු කිරීම සහ වඩා හොඳ පහසුකම් සැලසීම අරමුණු කරගනිමින්, සහනාධාර උපාය මාර්ගය වෙනස් කර ඇතත්, එය බෝග නිෂ්පාදනයේදී පොහොර භාවිතය

තාර්කිකකරණය කිරීමට උපකාරී විය හැකි පාංශු පරීක්ෂණ ප්‍රතිඵල සමඟ උපායමාර්ගිකව නොගැලපේ.

### ii. මහා පරිමාණ ආයෝජන ව්‍යාපෘති

ද්‍රව්‍යමය ආධාර ලබා දෙමින් වැඩසටහන් සඳහා සහාය වීම, ණය, ද්‍රව්‍ය, උපකරණ, පර්යේෂණ සහ සංවර්ධන, අගය දාම සංවර්ධනය, පුහුණුව සහ පොදු කෘෂිකර්ම යටිතල පහසුකම් සැපයීම යන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද විදේශ මූල්‍යකරණ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති පහක් (*5*) කෘෂිකර්ම අමාත්‍යාංශය *සතුව* ඇත. ආසන්න වශයෙන්, *2023* ප්‍රාග්ධන අයවැයෙන් *60%*ක් මෙම ව්‍යාපෘති සඳහා වෙන් කෙරේ. මෙම සියලු ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර ලබා දෙන්නේ ණය ආධාර මඟින් වන අතර කාර්ය මණ්ඩල සාමාජිකයින් 233 දෙනෙකුගෙන් යුත් වෙනම ව්‍යාපෘති කළමනාකරණ ඒකක (*PMUs)* යටතේ ක්‍රියාත්මක වේ. තවද, මෙම ව්‍යාපෘති පහේ මුළු ආයෝජනයෙන් 6%ක් පමණ ඒවායේ මෙහෙයුම් සහ කාර්ය මණ්ඩල වියදම් සඳහා යොදවන බව විශ්ලේෂණයෙන් අනාවරණය විය. කමිටුව මෙම සියලු ව්‍යාපෘති සහ වැඩසටහන් ඔවුන්ගේ ව්‍යාපෘති සංවර්ධන අරමුණුවලට අනුකූලව සමාලෝචනය කළ අතර ඒවායේ ප්‍රතිදාන බෙදාහැරීම, අදාළ සම්බන්ධතා, කාලානුරූපී බව, ප්‍රතිලාභීන්, මූලික අවස්ථාව සහ මේ දක්වා ප්‍රගතිය, ඇස්තමේන්තු සාධාරණීකරණය යනාදිය පිළිබඳව අදහස් දක්වන ලදී. මෙම ව්‍යාපෘති පහෙන් හතරක්ම ඒවායේ නියමිත කාලසටහන්වලට පසුපසින් ක්‍රියාත්මක වෙමින් කාලය දීර්ග කිරීම් ලබාගෙන ඇති අතර ඉන් ජාතික අයවැයට අමතර වැය බරක් දැරීමට සිදුව ඇත.

### iii. බීජ සහතික කිරීම සහ පැළෑටි සංරක්ෂණය

බීජ සහතික කිරීම සාර්ථක බෝගයක් සඳහා මූලික කාරණයක් සේම වැදගත් අවදානම් කළමනාකරණ මෙවලමකි. බීජ සහතික කිරීමේ ක්‍රියාවලිය හරහා බීජ නඩත්තු කිරීම සහ නිෂ්පාදනය කිරීම සහ මහජනතාව අතර ප්‍රචාරණය කිරීමෙන් ශ්‍රී ලංකාවේ වගා කරන ප්‍රභේදවල ජානමය අනන්‍යතාවය සහ ජාන සංශුද්ධතාවය සහතික කරනු ඇත. සහතික කළ බීජ භාවිතය සමඟම, කෘෂිකාර්මික භෝග හානිය අවම කිරීම සඳහා පරිසර හිතකාමී, ආර්ථික වශයෙන් ඵලදායී සහ ඵලදායී පළිබෝධ කළමනාකරණ උපාය මාර්ග අනුගමනය කිරීම වැදගත් වන අතර එමඟින් බෝග ඵලදායිතාව ඉහළ

නංවයි. ශ්‍රී ලංකාව තුළ වැඩිදියුණු කළ බීජ සහතික කිරීමේ වැඩසටහනක අවශ්‍යතාවය හඳුනා ගනිමින්, 2022 ට (රුපියල් මිලියන 780ක්) සාපේක්ෂව 2023දී ජාතික අයවැයෙන් (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා රුපියල් මිලියන 2,000) ප්‍රතිපාදන වශයෙන් වෙන් කරන ලද අරමුදල්වල සැලකිය යුතු වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

මෙම වැය විෂයයේ අරමුණ වන්නේ ගොවිතැන සඳහා අවශ්‍ය ප්‍රමාණයට ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාදීමයි. ප්‍රත්‍යස්ථ සහ දියුණු කෘෂිකාර්මික අංශයක් පෝෂණය කිරීමේදී බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණයේ වැදගත්කම හඳුනා ගනිමින්, කෘෂිකාර්මික බීජ හා රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මකභාවය, ශක්‍යතාව සහ ආරක්ෂාව සහතික කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශය කැපවී සිටී. ජාතික ආහාර සුරක්ෂිතතාව ශක්තිමත් කිරීම, භෝග ඵලදායිතාව ඉහළ නැංවීම සහ ජෛව විවිධත්වය සුරක්ෂිත කිරීම සඳහා වූ දැක්මක් ඇතිව, සවිමත් බීජ සහතික කිරීම සහ ශාක ආරක්ෂණ වැඩසටහන් සීරුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය ඉතා වැදගත් වේ. එබැවින් ඉලක්කය පිළිබඳ පැහැදිලි සමස්ත අදහසක් ලබා ගැනීම සඳහා ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා මධ්‍ය කාලීන සැලැස්මක් ක්‍රියාත්මක විය යුතුය. තවද, වාර්ෂික අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමට පෙර ආයෝජනවල ප්‍රතිඵල විශ්ලේෂණය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සහතික කළ බිත්තර වී සහ අනෙකුත් සහතික කළ බීජ නිෂ්පාදනය හා භාවිතය වසරින් වසර ඉහළ යාම මත පසුගිය වසර පහ තුළ ඇතිකරගත් සාර්ථක ප්‍රතිඵල පිළිබඳ වාර්තාවක් අත්‍යවශ්‍ය සාධකයකි.

### iv. ආහාර සුරක්ෂිතතා වැඩසටහන

ජාතික මට්ටමේ ආහාර සුරක්ෂිතතාව සාක්ෂාත් කර ගත හැක්කේ, සෑම අවස්ථාවකදීම, ක්‍රියාශීලී සහ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා ඔවුන්ගේ ආහාර අවශ්‍යතා සහ ආහාර රුචිකත්වයන් සපුරාලන, ප්‍රමාණවත්, ආරක්ෂිත සහ පෝෂ්‍යදායී ආහාර සඳහා ප්‍රමාණවත් භෞතික හා ආර්ථික ප්‍රවේශයක් හිමි වන විටකදී පමණි. ජාතික සමෘද්ධිය සහ යහපැවැත්ම සඳහා පදනමක් ලෙස ආහාර සුරක්ෂිතතාවයේ තීරණාත්මක වැදගත්කම හඳුනා ගනිමින්, සියලු ජනයාට ආරක්ෂිත සහ පෝෂ්‍යදායී ආහාර ස්ථාවර සහ ප්‍රමාණවත් ලෙස දැරිය හැකි මිලකට සැපයුමක් සහතික කිරීම සඳහා ශක්තිමත් සහ පුළුල් ආහාර සුරක්ෂිතතා වැඩසටහනක්

ක්‍රියාත්මක කිරීමේ වගකීම කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත පවරා ඇත. එපමණක් නොව, කෘෂිකර්ම අමාත්‍යාංශය ආහාර සුරක්ෂිතතා අභියෝගවලට මුහුණ දීම සඳහා සමස්ත සහ සහභාගීත්ව ප්‍රවේශයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ගොවීන්, සිවිල් සමාජ සංවිධාන, පෞද්ගලික අංශයේ ආයතන සහ ජාත්‍යන්තර හවුල්කරුවන් ඇතුළු විවිධ පාර්ශවකරුවන් සමඟ සමීපව සහයෝගයෙන් කටයුතු කරයි. හවුල්කාරිත්වයන් දිරිගන්වමින් සහ දැනුම හුවමාරු කර ගනිමින්, තිරසාර ආහාර සුරක්ෂිතතා ඉලක්ක සපුරා ගැනීම සඳහා සාමූහික විශේෂඥතාව සහ සම්පත් උපයෝගී කර ගැනීමට කෘෂිකර්ම අමාත්‍යාංශය අපේක්ෂා කරයි.

ඒ අනුව, (අ) විශේෂ ආහාර සුරක්ෂිතතා වැඩසටහනක් (කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා රුපියල් මිලියන *2,000), (ආ)* සුළු වාරිමාර්ග පද්ධති සහ පුරන් කුඹුරු ඉඩම් (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා රුපියල් මිලියන *3,000), (ඇ)* අතිරේක බෝග වගා වැඩසටහන සහ බෝග නිෂ්පාදනය (කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා රුපියල් මිලියන *100), (ඈ)* තරුණයින් කෘෂිකාර්මික කර්මාන්තයේ රඳවා තබා ගැනීම සහ තරුණයින් කෘෂිකර්මාන්තයේ ප්‍රධාන ධාරාවට යොමු කිරීම. (කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා රුපියල් මිලියන 120*)* යන සංරචක හතරක් යටතේ ජාතික අයවැයෙන් 2023 දී රුපියල් මිලියන 5,220 ක මුළු මුදලක් වෙන් කර ඇත. යෝජිත ක්‍රියාකාරකම්වල වැදගත්කම හඳුනා ගනිමින්, මෙම ව්‍යාපෘති සංරචක සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායක පැහැදිලිව නිර්වචනය කර නොමැති අතර, මෙම ප්‍රතිපාදන වලට අදාල වැය විෂය ස්වරූපය අනුව ප්‍රාග්ධනය ද පුනරාවර්තන ද යන්න පිළිබඳ පැහැදිලි සීමා නිර්ණය කිරීමක් නොමැති බව කමිටුවට නිරීක්ෂණය විය. එවැනි අඩුපාඩුවක් ලබන වසරේ අයවැයෙන් විසඳාගත යුතුව ඇත. තවද, මෙම වැඩසටහන යටතේ එන වැය විෂය වැඩසටහනේ පරමාර්ථය/පරමාර්ථ සමග අනුගත වන බව සහතික කිරීම සහ ඒවාට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වේ.

### v. පශු සම්පත් සංවර්ධනය සහ කිරි නිෂ්පාදනය

කෘෂිකාර්මික අංශය ශක්තිමත් කිරීමේදී සහ ග්‍රාමීය ජීවනෝපාය නගා සිටුවීමේ දී පශු සම්පත් සංවර්ධනයේ සහ කිරි නිෂ්පාදනයේ තීරණාත්මක කාර්යභාරය හඳුනා ගනිමින්, කෘෂිකර්ම අමාත්‍යාංශය මෙම ක්ෂේත්‍රය තුළ පුළුල් සහ තිරසාර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට කැපවී සිටී. උසස් තත්ත්වයේ කිරි නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සහ ගොවීන්ගේ සමාජ-ආර්ථික යහපැවැත්ම නඟා සිටුවීම ඇතුළුව පශු සම්පත් ඵලදායිතාව ඉහළ නැංවීමේ අදහසින්, සමෘද්ධිමත් සහ අනුවර්තිත පශු කර්මාන්තයක් ගොඩනැගීමට කෘෂිකර්ම අමාත්‍යාංශය උත්සහ කරයි.

ඒ අනුව, (අ) දියර කිරි පරිභෝජනය සඳහා පහසුකම් සැලසීම සහ ප්‍රවර්ධනය කිරීම (කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා රුපියල් මිලියන 25), (ආ) පශු සම්පත් අභිජනන වැඩසටහන (DAPH සඳහා රුපියල් මිලියන 200) (ඇ) කුණ්ඩසාලේ කෘතිම සිංචන (AI) මධ්‍යස්ථානයේ වැඩිදියුණු කළ අභිජනන නිෂ්පාදනය හරහා දියර කිරි නිෂ්පාදනය වැඩි කිරීම (DAPH සඳහා රුපියල් මිලියන 100), (ඈ) සත්ව අභිජනන ගොවිපලවල් පිහිටුවීම (කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා රුපියල් මිලියන 50), (ඉ) කුඩා හා මධ්‍ය පරිමාණ සංවර්ධනය පශු සම්පත් (කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා රුපියල් මිලියන 250), (ඊ) එළු අභිජනනය (කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා රුපියල් මිලියන 150), (උ) කුර සහ මුඛ රෝග සඳහා දේශීයව එන්නත් නිෂ්පාදනය කිරීම (DAPH සඳහා රුපියල් මිලියන 126.5), සහ (ඌ) ඉහළ- ගුණාත්මක වැස්සි පැටවුන් (DAPH සඳහා රුපියල් මිලියන 71) යන ව්‍යාපෘති අටක් යටතේ 2023 වසර සඳහා රුපියල් මිලියන 971 ක මුදලක් වෙන් කර ඇත. යෝජිත ක්‍රියාකාරකම් වැදගත්වුවද, සමහර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් නොමැති බවත්, ආයෝජන මගින් සමාජයට වර්ධක ප්‍රතිලාභ පෙන්වා නොමැති බවත් කමිටු විසින් නිරීක්ෂණය කරනු ලැබුණි. තවද, 2023 සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන පෙර වසරේ වගකීම් නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් නොවීම මෙන්ම මෑතකාලීන මිල ඉහළ යාමත් සමඟ සැලසුම් සහගත ක්‍රියාකාරකම් සිදු කිරීමට ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ව්‍යාපෘති වල ප්‍රගතිය අඩාළ වී ඇත.

### vi. විශ්‍රාම වැටුප් සහ රක්ෂණය

කෘෂිකාර්මික නිෂ්පාදනයේ ආර්ථික හානි සමනය කිරීමට සහ පළිබෝධ සහ රෝග ආක්‍රමණය, බෝග විනාශය, දේශගුණික විපර්යාස සහ ස්වාභාවික විපත් වැනි කෘෂිකාර්මික ව්‍යවසායන් සමඟ බොහෝ විට සම්බන්ධ වන ඉහළ අවදානම් සහ අවිනිශ්චිතතා අවම කිරීමට රක්ෂණය උපකාරී වේ. විශ්‍රාම වැටුප් මගින් සාපේක්ෂ වයෝවෘද්ධ ගොවීන්ට ඔවුන්ගේ ජීවනෝපාය සඳහා අඛණ්ඩ ආදායමක් ලබා දෙනු ඇත. ඔවුන්ගේ කෘෂිකාර්මික සමෘද්ධිය තුළ ගොවීන්ට අභියෝග කරන ආවේණික අවදානම් සහ අවිනිශ්චිතතාවයන් හඳුනා ගනිමින්, කෘෂිකර්ම අමාත්‍යාංශය කෘෂිකර්මාන්තයට අදාළ රක්ෂණ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට කැපවී සිටී. ගොවීන්ගේ ජීවනෝපාය සුරක්ෂිත කිරීම, දුෂ්කරතාවලට ඔරොත්තු දීමේ හැකියාව සහ තිරසාර කෘෂිකාර්මික භාවිතයන් පෝෂණය කිරීමේ

අරමුණින්, ශක්තිමත් සහ පරිපූර්ණ කෘෂිකාර්මික රක්ෂණ රාමුවක් ස්ථාපිත කිරීමට අමාත්‍යාංශය ප්‍රයත්න දරයි. ඒ අනුව, (අ) වැඩිහිටි ගොවීන් සඳහා විශ්‍රාම වැටුප (*AAIB* සඳහා රුපියල් 4,750) සහ (ආ) ගොවීන් සඳහා දායක රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම (*AAIB* සඳහා රුපියල් 1000) යන ව්‍යාපෘති දෙකක් ඉලක්ක කර ගනිමින් 2023 වසර සඳහා රුපියල් මිලියන 5,750 ක මුළු මුදලක් වෙන් කර ඇත. රක්ෂණාවරණය සහ රක්ෂණ ක්‍රමය පිළිබඳ පැහැදිලිව අවබෝධ කර ගැනීම සඳහා එවැනි තොරතුරු අත්‍යවශ්‍ය බව කමිටුව සලකයි. "දායකත්ව රක්‍ෂණ යෝජනා ක්‍රමය" සඳහා ගොවීන්ගෙන් වාරික දායකත්වයක් නොමැති අතර එය රජය විසින් දරනු ලබන බැවින් මහා භාණ්ඩාගාරයට වැය බරක් ඇති කරන බවද කමිටුව සඳහන් කළේය.

### vii. පර්යේෂණ සහ සංවර්ධනය

කෘෂිකාර්මික නිෂ්පාදනය සඳහා භාවිතා කරන බෝග සහ සතුන්, කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා භාවිතා කරන හෝ ඉන් බලපෑමට ලක්වන ස්වභාවික සම්පත් පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය; සහ නිෂ්පාදන පද්ධති සහ ඒවායේ සහාය කෘෂිකාර්මික පද්ධති වැඩිදියුණු කිරීම සඳහා සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීමට උපකාරී වේ. කෘෂිකාර්මික පර්යේෂණ සහ සංවර්ධන සඳහා (*R&D)* රාජ්‍ය ආයෝජනය ආහාර සුරක්ෂිතතාව සහ පාරිසරික තිරසාරභාවය සඳහා වැදගත් වේ. තාක්‍ෂණික දියුණුවත් සමඟ කෘෂිකාර්මික අංශයට සුදුසු නවීකරණය අවශ්‍ය වන බැවින්, ජීව විද්‍යාත්මක හා දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති වන අවදානම්, කම්පන සහ තර්ජන ජය ගැනීම පිණිස, පරිසර සංවේදී පර්යේෂණ හා සංවර්ධනය සඳහා ආයෝජනය කිරීමට ප්‍රයත්න දැරීම අත්‍යවශ්‍ය වේ.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රධාන විෂය පථය ලෙස පවතින සහල් පර්යේෂණ හා සංවර්ධන ආයතනය (*RRDI),* ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (*FCRDI)* සහ උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය (*HORDI* වශයෙන් ආයතන තුනක්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තුළ පිහිටුවා ඇති බව නිරීක්ෂණය වී ඇත. මීට අමතරව, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති තවත් ආයතන *08*ක් පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල ඔවුන්ගේ ප්‍රධාන විෂය පථය නොසලකා නිරත වේ. මෙම පර්යේෂණ හා සංවර්ධන ආයතන අට සඳහා *2023* වසරට රුපියල් මිලියන *930* ක මුදලක් වෙන් කර ඇත.

ඵලදායිතාව ඉහළ නැංවීමේ අත්‍යවශ්‍ය අංගයක් වන පර්යේෂණ සහ සංවර්ධනය සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම කමිටුව ඉහළින් පිළිගනී, කෙසේ වෙතත්, අරමුදල් ප්‍රතිපාදන මඟින් සිදු කරන ලද පර්යේෂණ ක්ෂේත්‍ර ද්විකරණය වීමේ හැකියාවද නිරීක්ෂණය කළේය (උදා: රාජ්‍ය දෙපාර්තමේන්තු සහ විශ්ව විද්‍යාල). පර්යේෂණ ප්‍රතිඵල ව්‍යාප්ති සේවා සමඟ බෙදා ගැනීම සඳහා ඵලදායී යාන්ත්‍රණයක් නොමැති වීම සහ වැඩිදුර පර්යේෂණ සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ ප්‍රයෝජනය සඳහා ඩිජිටල් ආකාරයෙන් පර්යේෂණ ගබඩාවක් නොතිබීම ද කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා ඵලදායි ලෙස යොදාගැනීම පිණිස පර්යේෂණ මගින් කෙරෙන අනාවරණයන් විශ්ලේෂණය කිරීම සඳහා එවැනි තොරතුරු වාර්ෂික පදනමින් ලබා ගැනීම වැදගත් වේ.

### viii. ආයතනික සංවර්ධනය සහ ප්‍රාග්ධන හුවමාරුව

ප්‍රමාණවත් නොවන මානව සහ ආයතනික ධාරිතාව, ග්‍රාමීය දරිද්‍රතාවය, සාපේක්ෂ අඩු කෘෂිකාර්මික ඵලදායිතාව, ආහාර අනාරක්ෂිත බව සහ විශ්වසනීය හා ස්ථාවර තොරතුරුවල දුර්වල ප්‍රවාහය ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රකෘතිමත් වීමේ මාවත මන්දගාමී වීමෙහිලා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කර ඇත. කෘෂිකාර්මික අංශය මානව ප්‍රාග්ධනය සහ ආයතනික දායකත්වය, සැලකිය යුතු දායකත්වයක් සපයන කෘෂිකාර්මික අංශය ද මෙයින් ව්‍යුක්ත නොවේ.

මෙම සංරචකය යටතේ 2023 වසර සඳහා වෙන් කර ඇති මුළු ප්‍රතිපාදන රුපියල් මිලියන 1,476ක් වන අතර එයට (අ) වී අලෙවි මණ්ඩලය (PMB; රුපියල් මිලියන 300, (ආ) ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය (NFPB; රුපියල් මිලියන 5), (ඇ) ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණය සහ බේරුම්කරණ අධිකාරිය (හදබිම අධිකාරිය; රුපියල් මිලියන 200), (ඈ) ජාතික පොහොර ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් කාර්යාල වැඩිදියුණු කිරීම (NFC; රුපියල් මිලියන 20), (ඉ) ගොඩනැගිලි සහ ව්‍යුහයන් (DAD සඳහා රුපියල් මිලියන 850), (ඊ) පැල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ (DAD සඳහා රුපියල් මිලියන 101) ඇතුලත් වේ.

ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා අත්‍යවශ්‍ය වුවද, ඉහත සාකච්ඡා කරන ලද ප්‍රධාන කොටස් අතෙන් බොහොමයක් සඳහා ක්‍රියාත්මක කිරීමේ සැලසුම් නොමැති බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. තවද, බිම් මට්ටමේ ප්‍රතිඵල ලබා දීම සහතික කිරීම සඳහා සැලසුම් කිරීමේ ප්‍රවේශයේ ඇති දුර්වලතා සහ ඵලදායී ප්‍රතිපෝෂණ යාන්ත්‍රණයක් නොමැතිකම, ජාතික සහ පළාත් වශයෙන් කෘෂිකර්මාන්තයේ (හොඳින් ස්ථාපිත

පද්ධතිය පිළිගන්නා අතරම) පරිපාලන ක්‍රියාවලියේ බරපතල අඩුපාඩු පවතී. කෘෂිකර්ම අමාත්‍යාංශය හි සමස්ත අරමුණු නියමිත වේලාවට සාක්ෂාත් කර නොගැනීමට මෙය ප්‍රධාන හේතුවක් විය හැකිය.

කෘෂිකර්ම අමාත්‍යාංශය සහ රේඛීය දෙපාර්තමේන්තු/ නියෝජිතායතන යටතේ කාර්ය මණ්ඩලය 28,000 ක් පමණ සේවයේ යොදවා ඇති අතර පුහුණු සහ දක්ෂ මානව සම්පත්වලින් බහුල වේ. (ඇමිණුම) කෘෂිකර්ම අමාත්‍යාංශය සමස්ත මානව සම්පත් අවශ්‍යතාවයෙන් 78%ක් සපුරා ඇතත්, එහි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වැනි ආයතනවල ප්‍රගතිශීලී ස්වභාවයට සහාය වන මූලික මානව සම්පත වන තාක්ෂණික තනතුරුවල (ප්‍රධාන විද්‍යාඥයින්, කෘෂිකර්ම උපදේශකවරුන් (AIs) දැනට සේවයේ නිරත කාර්ය මණ්ඩලය, එක් එක් තාක්ෂණික කාණ්ඩයේ අවශ්‍යතාවයෙන් 40% ට වඩා අඩුය. කෘ.උ.වරුන් යනු බිම් මට්ටමේ ගොවීන්ට ව්‍යාප්ති සේවා සපයන ප්‍රධාන පුද්ගලයින් වෙතත්, සැබෑ කාර්ය මණ්ඩලය අවශ්‍යතාවයෙන් 40% කට වඩා අඩුය. මුල් විෂය පථයෙන් බැහැර වූ බැවින්, කෘ.උ.වරුන් අධීක්ෂණය යටතේ කෘෂිකාර්මික පර්යේෂණ සහ නිෂ්පාදන සහායකයින් (ARPA) බඳවා ගැනීම සහ පුහුණු කිරීම තුළින් ව්‍යාප්ති සේවා ශක්තිමත් කිරීමට ගත් උත්සාහයන් කාලයත් සමඟ දියාරු වී ඇති බව කමිටුව නිරීක්ෂණය කළේය. ARPA හි අවශ්‍යතාවයෙන් 74% ක් DAD යටතේ සපුරා ඇතත්, ඔවුන්ගේ සම්බන්ධය DAD ක්‍රියාකාරකම්වලට පමණක් සීමා වී ඇති බැවින්, DOA යටතේ කෘ.උ.වරුන් 850ක් විසින් කරන ලද බිම් මට්ටමේ කෘෂිකාර්මික ව්‍යාප්ති ක්‍රියාකාරකම් කෘෂිකර්මාන්තයට අදාළ අරමුණු සපුරාලීම සඳහා ප්‍රමාණවත් ලෙස සිදු නොකෙරේ. මීට අමතරව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු යටතේ කාර්ය මණ්ඩලය 4000ක් පමණ සේවයේ යොදවා ඇති අතර ඉන් 1500ක් පමණ කෘෂි ව්‍යාප්ති කටයුතුවල නිරත වෙති. ඒ අනුව එක් කෘ.උ.වරයෙකුට ගොවි පවුල් 800ක් පමණ සඳහා සේවා සැපයීමට සිදුවන බව සටහන් වේ. මෙය රටේ කෘෂිකාර්මික සංවර්ධනයට අහිතකර ලෙස බලපානු නොඅනුමානය. කෘෂිකාර්මික අංශය සඳහා වඩාත් තාක්ෂණික නැඹුරු බඳවා ගැනීම් සිදු කිරීමෙන් තත්ත්වය ලිහිල් වනු ඇති බව කමිටුව නිරීක්ෂණය කරයි.

2023 වසර සඳහා යටිතල පහසුකම් ගොඩනැගීම සඳහා වන ප්‍රාග්ධන ප්‍රතිපාදන සඳහා වැය කිරීම සීමා කරමින්, පසුගිය දා නිකුත් කරන ලද මූල්‍ය චක්‍රලේඛවල විධිවිධාන මගින් ඉදිකිරීම් සම්බන්ධ සැලසුම්ගත ක්‍රියාකාරකම්වලට බාධා එල්ල වී ඇති බව කමිටුව වැඩිදුරටත් සඳහන් කළේය. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබන සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය අත්‍යවශ්‍ය වේ, නමුත් වර්තමාන භාවිතය මඟින් සම්පත් හිඟය ගැන නිසි සැලකිල්ලක් දක්වමින් ඒවා ක්‍රමානුකූලව

ප්‍රතිසංස්කරණය කරනවා වෙනුවට ප්‍රතිලාභ, වාරිමාර්ග ප්‍රදේශය, අවශ්‍යතාවය, විකල්ප ජල මූලාශ්‍ර ආදිය මත පදනම් වූ පරිපූර්ණ ප්‍රවේශයක් කෙරෙහි ප්‍රමාණවත් ලෙස අවධානය යොමු නොකර තාවකාලික තේරීමක් සිදු කරයි. එබැවින්, මෙම ඉදිකිරීම්/පුනරුත්ථාපන බොහෝමයක් ප්‍රතිලාභීන් සඳහා ධනාත්මක බලපෑමක් ලෙස නොපෙනෙන බව කමිටුව සඳහන් කරයි.

## 3. පවත්නා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවල ද්විකරණය, නාස්තිය සහ සුළු ව්‍යාපෘති හෝ වියදම් හඳුනාගැනීම.

PERC කමිටුව කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි පවතින අයවැයේ ද්විකරණය, නාස්තිය සහ සුළු ව්‍යාපෘති/වියදම් අයිතම හඳුනාගෙන පහත පරිදි නැවත සලකාබැලීමට නිර්දේශ කරන කරයි.

### ද්විකරණය.

කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් සිදු කරන ක්‍රියාකාරකම්වලින් බහුතරයක් බිම් මට්ටමින් ක්‍රියාත්මක වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ක්‍රියාකාරකම්වල ස්වභාවය, සංකීර්ණභාවය, ක්‍රියාකාරකම්වල ආවරණ කලාපය පුළුල් වීම, සැලකිය යුතු සේවාදායක කණ්ඩායමක් සම්බන්ධ කර ගැනීම මෙන්ම බිම් මට්ටමේ දී විවිධ අංශ සඳහා ද්‍රව්‍යමය ආධාර සහ මුදල් ප්‍රදාන පිරිනමන්නා වූ රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන වෙනත් පිරිවැය අවමකිරීමේ වැඩසටහන් හේතුවෙන් මෙම ක්‍රියාකාරකම් සඳහා අරමුදල් වෙන් කිරීම ඇතැම් ද්විකරණයන්ට තුඩු දිය හැකිය. කෘෂිකර්ම අමාත්‍යාංශයේ අයවැය යටතේ බෝග නිෂ්පාදනය, පර්යේෂණ සහ සංවර්ධන, ද්‍රව්‍යාධාර, යටිතල පහසුකම් සංවර්ධනය, සහ ජීවනෝපාය ආධාර වැනි විවිධ ක්ෂේත්‍රවල එවැනි ද්විකරණ සිදුවිය හැක. කෙසේ වෙතත්, මෙම ද්විකරණ හඳුනා ගැනීම පැහැදිලිවම අභියෝගාත්මක කාර්යයක් වන අතර ප්‍රධාන කාර්යසාධන දර්ශක KPIs (Key Performance Indicators) මත පදනම්ව මෙහෙයුම් සහ ප්‍රතිඵල පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් අවශ්‍ය වේ (උදාහරණ: අතිරේක බෝග වගා වැඩසටහන සහ ආහාර සුරක්ෂිතතා වැඩසටහන, ගෙවතු වැඩසටහන).

### නාස්තිය

විවිධ පැතිවලින් අපතේ යෑම් සිදුවිය හැකි නමුත් එවැනි නාස්තියක් සිදු විය හැකි අංශ සඳහා සම්පත් වෙන් කිරීම ප්‍රශස්ත කිරීම, ඵලදායිතාව ඉහළ නැංවීම සහ විවිධ ක්ෂේත්‍රවල තිරසාර ප්‍රතිඵල අත්කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. වෙන් කළ අරමුදල් නාස්තියකට ලක් විය හැකි සමහර නිර්ණායක පහත දැක්වේ.

- වෙන් කරන ලද අරමුදල් අපේක්ෂිත කාර්යය සඳහා ප්‍රශස්ත ලෙස භාවිතා නොවීම.
- නියාමන කාරයයන් සඳහා අවශ්‍ය (නීතිමය) ප්‍රතිපාදන සැලසීමකින් තොරව භාවිතය සඳහා අරමුදල් වෙන් කිරීම. උදා: පස් පිළිබඳ පරීක්ෂණය කර ප්‍රතිඵල ලබා ගැනීම, පොහොර භාවිතය පිළිබඳව නිර්ණය කිරීම සඳහා දැනට අනිවාර්ය අවශ්‍යතාවයක් බවට පත් කර නොමැත).
- ලබා දී ඇති මුදල් ප්‍රදාන සහ ද්‍රව්‍යාධාර අපේක්ෂිත කාර්යය සඳහා භාවිතා කරන්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා නිසි යාන්ත්‍රණයක් නොමැතිව වැඩසටහන් සඳහා අරමුදල් වෙන් කිරීම (උදා: අතිරේක බෝග වගා වැඩසටහන සහ ආහාර සුරක්ෂිතතා වැඩසටහන).

### සුළු ව්‍යාපෘති/ආයතන

අමාත්‍යාංශයේ හෝ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ අධිකාරිය සමඟ නොගැලපෙන ඕනෑම ව්‍යාපෘතියක් මූල්‍යකරණය සඳහා නොවැදගත් ලෙස සැලකිය හැකිය. තවද, ව්‍යාපෘතියක් එහි අපේක්ෂිත ඉලක්ක සපුරා ඇති විට සහ එහි ක්‍රියාකාරීත්වය නිශ්චිත අරමුණකින් තොරව ඇදී යන විට අඛණ්ඩව මූල්‍යකරණය කිරීම යෝග්‍ය නොවේ. එබැවින්, එවැනි සුළු ව්‍යාපෘති/ආයතන පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය (උදා: ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය, CARP, හදබිම අධිකාරිය) මූල්‍යකරණයට පෙර නැවත තක්සේරු කළ යුතුය.

## 4. අවශ්‍යතාවය හේතුයුක්ත කරන ප්‍රමුඛතා ව්‍යාපෘති හඳුනා ගැනීම, අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන අවම වශයෙන් මූලික ව්‍යාපෘති 3ක් හඳුනා ගැනීම සහ එවැනි ව්‍යාපෘති ඔවුන්ට ලබාදීමට හේතුකාරණයන් සෙවීම.

යෝජිත සෑම ව්‍යාපෘතියක්ම ඒවායේ අරමුණු, ගුණාත්මකභාවය, අනිවාර්ය කාර්යයන්, ප්‍රමිතීන් සහ අදාළ අවශ්‍යතාවලට හානියක් නොවන පරිදි පිරිවැය ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක කළ යුතු බව කමිටුව අවධාරණය කරයි. අංශයේ ප්‍රමුඛතා සහ වත්මන් ආර්ථික තත්ත්වය සලකා බැලූ කමිටුව, ස්ථාපිත ප්‍රමුඛතා නිර්ණායක සහ ජාතික ආර්ථිකයට දක්වන දායකත්වය අනුව ඒවායේ වැදගත්කම මත පදනම්ව ව්‍යාපෘති සඳහා ප්‍රමුඛත්වය ලබා දුන්නේය.

අදාළ ආයතන විසින් ඉදිරිපත් කරන ලද කරුණු/දත්ත, සහ අදාළ නිලධාරීන්ගේ සාකච්ඡා සහ කමිටුවේ මතය මත පදනම්ව (අ) කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි දැක්ම සහ

අරමුණුවලට අනුකූල වීම, (ආ) පරතරය පියවීම සඳහා වෙනත් වැඩසටහන්වලට තිරස්/සිරස් ලෙස සම්බන්ධ කිරීම්, (ඇ) සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාව සහ ප්‍රතිඵල ජනනය සහ (ඈ) වත්මන් සහ පුරෝකථනය කළ අවස්ථා පිළිබඳ යන කරුණු සලකා බලමින් අයවැය මූල අයිතම 38ම විශ්ලේෂණය කරන ලදී. කෘෂිකර්ම අමාත්‍යාංශය හි දැක්ම තුළ ඉස්මතු කර ඇති පරිදි කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ සමස්ත රටම සාක්ෂාත් කර ගත යුතු සමස්ත ඉලක්කය ලෙස ආහාර සුරක්ෂිතතාවය සලකා බැලීමට කමිටුව තීරණය කළේය.. ඒ අනුව, කමිටුව සඳහා ලබා දී ඇති TOR අනුව හඳුනාගෙන ඇති ඉහළ ප්‍රමුඛතා ව්‍යාපෘති, පහේ සාධාරණීයකරණයද සහිතව වගුව-3 හි ලැයිස්තුගත කර ඇත.

**වගුව** 3: **ව්‍යාපෘති ප්‍රමුඛතාගතකරණය**

| වැඩසටහන | ප්‍රමුඛ මට්ටම | ප්‍රමුඛත්වය සඳහා හේතුකාරණය |
|---|---|---|
| පොහොර සහනාධාර වැඩසටහන | ඉහළ | ඵලදායිතාව වැඩි දියුණු කිරීම (ඒකක යෙදවුමක නිෂ්පාදනය වැඩි කිරීම) සහ ආහාර සුරක්ෂිතතාව සඳහා අවශ්‍ය ප්‍රධාන යෙදවුමකි. ශක්තිමත් ව්‍යාප්ති සේවා සමගින් දිවයින පුරා ආවරණය කෙරේ. |
| බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ පැළෑටි සංරක්ෂණය | ඉහළ | ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය ප්‍රධාන යෙදවුමකි. දිවයින පුරා සහතික කළ බීජ සහ රෝපණ ද්‍රව්‍ය භාවිතය වැඩි කිරීම. ශක්තිමත් ව්‍යාප්ති සේවා සමගින් දිවයින පුරා ආවරණය කෙරේ. |
| සුළු වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම | ඉහළ | ඉඩම් ඵලදායිතාව සහ බෝග විවිධාංගීකරණය සඳහා ඇති හැකියාව වැඩි කිරීම. ජල පරිහරණ කාර්යක්ෂමතාව වැඩි කිරීම. ශක්තිමත් ව්‍යාප්ති සේවා සමගින් දිවයින පුරා ආවරණය කෙරේ. |
| බෝවෙන රෝග පාලනය | ඉහළ | පශු සම්පත් සහ පශු සම්පත් නිෂ්පාදනවල ගුණාත්මකභාවය සහ ප්‍රමාණය වැඩි දියුණු කිරීම, ශක්තිමත් ව්‍යාප්ති සේවා සමගින් දිවයින පුරා ආවරණය කෙරේ. |
| කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය | ඉහළ | ගුණාත්මක අභිජනන ද්‍රව්‍ය සහ යටිතල පහසුකම් සැපයීම තුළින් කිරි නිෂ්පාදනය වැඩි කිරීම. |
| පොහොර වැඩසටහන සඳහා බැඳීම | ඉහළ | ඵලදායිතාව ඉහළ නැංවීමට දායක වීම සඳහා ප්‍රයත්න දරා ඇත. |

ප්‍රමුඛත්වය දීමට භාවිතා කරන නිර්ණායක සමඟ සෘජුව අනුගත වන ඉහත ඉහළ

ප්‍රමුඛතා ව්‍යාපෘතිවලට අමතරව, විදේශ ණය මූල්‍යකරණය යටතේ ක්‍රියාත්මක වන මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති පහක් ඇත. විසර්ජන ගිවිසුම්, මෙතෙක් සිදු කර ඇති ආයෝජන, දායකවීම් සහ පොලී ගාස්තු මෙන්ම ව්‍යාපෘති සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ වැදගත්කම සලකා බලා එම ව්‍යාපෘතිවලට ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදෙමින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සහ නියමිත කාල සීමාව තුළ සම්පූර්ණ කිරීමට කමිටුව නිර්දේශ කරයි.

## 5. ප්‍රශස්ත සම්පත් භාවිතය සහතික කිරීම සඳහා කාර්යක්ෂම හා ඵලදායී ක්‍රියා පටිපාටි සහ පිරිවැය සාධක හඳුනා ගැනීම.

කමිටුව, සාකච්ඡා වට කිහිපයකින් පසුව, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ එහි රේඛීය දෙපාර්තමේන්තු/නියෝජිත ආයතනවල ප්‍රශස්ත සම්පත් භාවිතය සහ ඵලදායී ප්‍රතිඵල සඳහා කාර්යක්ෂම හා ඵලදායී ක්‍රියා පටිපාටි සහ පිරිවැය සාධකවලට සහාය වීම සඳහා පහත සඳහන් දෑ හඳුනා ගන්නා ලදී.

- සහනාධාර වැඩසටහන් සඳහා වෙන් කරන ලද මුදලින් (උදා: පොහොර සහනාධාර වැඩසටහන) පහෙන් එකක් (21%) එහි මෙහෙයුම් සහ බෙදා හැරීමේ පිරිවැය සඳහා වැය කරන බව නිරීක්ෂණය වේ. මෙහෙයුම් පිරිවැයක් ලෙස වෙන් කර ඇති මෙම සැලකිය යුතු මුදල අලුතින් හඳුන්වා දුන් වවුචරය/මුදල් හුවමාරු ක්‍රමය සමඟ අයවැයෙන් ඉවත් කළ හැකි බව PERC නිරීක්ෂණය කරයි. තවද, පොහොර සහනාධාර ගෙවීම් පැහැදිලිව පෙන්නුම් කළ හැකි වන පරිදි දිගුකාලීන වගකීම් සහ පෙර වසරේ බිල්පත් ගෙවීම අයවැය ඇස්තමේන්තුවේ වෙන වෙනම පෙන්නුම් කිරීම සුදුසු බවයි.

- පොහොර කාර්යක්ෂම භාවිතය සඳහා පාංශු පරීක්ෂාව ඵලදායී පිළිවෙතක් වුවද, එය දැනට පොහොර සහනාධාර වැඩසටහනට සම්බන්ධ නොවේ. පොහොර භාවිතය සඳහා පාංශු පරීක්ෂාව අනිවාර්ය අවශ්‍යතාවයක් බවට පත් කිරීමට නියාමනයක් නොමැතිව එවැනි භාවිතයන් සඳහා මුදල් වෙන් කිරීම ද මුදල් අපතේ යාමට හේතු වේ. පාංශු පරීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව පොහොර නිකුත් කිරීමේ යාන්ත්‍රණයක් අනුගමනය කිරීම කාර්යක්ෂම පිරිවැය සාධකයක් මෙන්ම මනා ප්‍රතිසංස්කරණයක් ද වේ.

ගොවීන් වෙත මුදල් ප්‍රේෂණය කිරීම සහ පොහොර බෙදා හැරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව (DAD) යටතේ අන්තර්ජාල දත්ත ගබඩාවක් වන Geo-Goviya දැනට ක්‍රියාත්මක වේ. සියලුම ප්‍රතිලාභීන්ට අදාළ ආධාරක යෝජනා ක්‍රම සඳහා

තනි දත්ත පද්ධතියක් භාවිතා කිරීම ද්විකරණය පාලනය කර නිවැරදි ඉලක්ක හඳුනා ගැනීමට ඉවහල්වේ. එබැවින්, කෘෂිකර්ම අමාත්‍යාංශය සහ අනෙකුත් රේඛීය දෙපාර්තමේන්තු විසින් ක්‍රියාත්මක කරන ලද මුදල් ප්‍රදාන, ද්‍රව්‍යාධාර සහ සියලුම ප්‍රතිලාභී වැඩසටහන් ඇතුළත් කිරීම සඳහා ඒකාබද්ධ මාර්ගගත පොදු වේදිකාවක් ලෙස එවන් පහසුකමක් පුළුල් කිරීම ඉතා වැදගත් වේ.

- කෘෂිකර්ම අමාත්‍යාංශය සහ රේඛීය දෙපාර්තමේන්තු හොඳින් පුහුණු වූ, දක්ෂ, සහ ශාස්ත්‍රීය වශයෙන් දක්‍ෂතා ඇති මානව සම්පත්වලින් බහුල වේ. එබැවින්, සියලුම මහා පරිමාණ ව්‍යාපෘති එවැනි පුද්ගලයින්ගේ සේවය ලබා ලබාගැනීම මගින් සහ ඔවුන්ගේ ප්‍රවීණතාවයෙන් ප්‍රතිලාභ ලබයි. අවශ්‍ය වන්නේ විශේෂිත විෂයයන් සඳහා මානව සම්පත් නොමැති අවස්ථාවන්හිදී ඒවා සම්පූර්ණ කිරීම පමණි. මෙම පරිචය මඟින් ව්‍යාපෘති නිමැවුම්වල තිරසාරභාවය සහ හිමිකාරිත්වය ප්‍රවර්ධනය කිරීම, එවැනි ව්‍යාපෘතිවල ආයතනික ඉතිහාසය සුරක්ෂිත කිරීම මෙන්ම සංවර්ධන ව්‍යාපෘතිවල වත්කම් කාර්යක්ෂම ප්‍රේෂණය කිරීම සහ නඩත්තු කිරීම ද සිදුවේ.

- ඉදිරි වගා කන්නයේ කෘෂිකාර්මික කටයුතු සැලසුම් කිරීම සඳහා ප්‍රධාන පාර්ශ්වකාර ආයතනවල සහභාගීත්වය ලබාගැනීමේ යාන්ත්‍රණයක් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් මෑතකදී ආරම්භ කර ඇත. ගනු ලැබූ තීරණවල ප්‍රගතිය නිසි ලෙස නිරීක්ෂණය කිරීම සහ පාර්ශ්වකාර ආයතන අතර සහයෝගීතාව සහතික කිරීම සඳහා නිකුත් කරන ලද චක්‍රලේඛයක් සමඟ ක්‍රියාවලිය විධිමත් කිරීම ඇතුළත් කිරීම සඳහා මෙම යහ භාවිතය මාසිකව අඛණ්ඩව පවත්වාගෙන යා යුතුය.

- ව්‍යාප්ති සේවාවල අකාර්යක්ෂම බව සමඟ පර්යේෂණ (ඔධ්‍යම රජය) හා ව්‍යාප්ති සේවා (ප්‍රධාන වශයෙන් පළාත් සභා) අතර සබඳතාවය දුර්වල මට්ටමක පැවතීම ප්‍රධාන අඩුපාඩු ලෙස හඳුනා ගෙන ඇත. කෘෂිකාර්මික ව්‍යාප්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය මගින් අභිනියෝජිත විෂයක් බවත්, එහිදී අන්තර් පළාත් ප්‍රදේශවල ව්‍යාප්තිය (දිවයින පුරා පර්යේෂණ වැඩසටහන්වලට අමතරව) කෘෂිකර්ම දෙපාර්තමේන්තුවද, මහවැලි කෘෂිකාර්මික ප්‍රදේශවල ව්‍යාප්තිය සම්බන්ධව ශ්‍රී ලංකා

- 

මහවැලි අධිකාරියද වගකීම දරන්නේය යන්න කමිටුව පිළිගනී. රටෙහි කෘෂිකාර්මික අංශයේ ප්‍රගතියෙහි ප්‍රධාන පසුබෑමක් සහ කෘෂිකර්මාන්තයේ රාජ්‍ය වියදම් අකාර්යක්ෂම ලෙස භාවිතා කිරීමට හේතු වූ ප්‍රධාන සාධකයක් ලෙස කමිටුව විසින්

මෙම විසිරුණු සහ එම නිසා දුර්වල පර්යේෂණ-ව්‍යාප්ති සබඳතාවය බැරෑරුම් ලෙස සලකා බලන ලදී.

- DOA විසින් 2016 වසරේ සිට **ශ්‍රී ලංකා යහ කෘෂිකාර්මික භාවිතයන්** (SLGAP) සහතික කිරීමේ වැඩසටහනක් ක්‍රියාවට නංවා ඇත. කෙසේ වෙතත්, SLGAP මාර්ගෝපදේශ ගෝලීය GAP සමඟ අනුගත වන පරිදි ස්ථාපිත කර ඇති අතර එමඟින් ග්‍රාමීය ගොවීන්ට එයට අනුකූලවීම දුෂ්කර වේ. මීට අමතරව, SLGAP ප්‍රධාන වශයෙන් DOA විසින් ලබා දී ඇති නිර්දේශ මත පදනම්ව ක්‍රියාත්මක වන අතර, මෙම සාර්ථකත්වය සඳහා නිර්දේශිත කෘෂිකාර්මික යෙදවුම් ලබා ගත හැකි, ප්‍රවේශ විය හැකි සහ දැරිය හැකි මිලකට ලබා දිය යුතුය. කෘෂිකාර්මික යෙදවුම් නියමිත වේලාවට සහ දැරිය හැකි මිල ගණනකට නොලැබීම හේතුවෙන් ගොවි ප්‍රජාව SLGAP වෙතින් ඈත්වීමට හේතු වී ඇත. ලිහිල් මාර්ගෝපදේශන සහිත ආරම්භක-GAP මඟින් ගොවි ප්‍රජාවට තාක්ෂණික ප්‍රවාහ අනුගත වීමට සහ එමඟින් ඵලදායිතාව සහ ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීමට, සහ කෘෂිකාර්මික යෙදවුම් අවභාවිතය වැළැක්වීමෙන් කෘෂිකාර්මික කටයුතු සඳහා රාජ්‍ය මූල්‍ය ඵලදායී ලෙස භාවිතා කිරීමට උපකාරී වනු ඇති බව කමිටුවේ අදහස විය.

## 6. කෘෂිකර්ම අමාත්‍යාංශය සිය වගකීම් ඉටු කරන්නාවූ සහ "නිසි පිරිවැය-නිසි කලට" ආකාරයෙන් රජයේ අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කරගන්නාවූ ප්‍රතිසංස්කරණ සහ ව්‍යුහයන් යෝජනා කිරීම.

කෘෂිකර්ම අමාත්‍යාංශය සිය වගකීම් ඉටු කිරීම සහ රජයේ අපේක්ෂිත ඉලක්ක ඵලදායී, ලාභදායී සහ කාලෝචිත ආකාරයකින් සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා PERC පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි:

1. “දැක්ම” මඟින් සමස්ත කෘෂිකාර්මික අංශය කෙරෙහි අවධානය යොමු කරන අතර, මෙහෙවර බොහෝ දුරට යොමු වී ඇත්තේ අපනයන කෘෂිකර්මාන්තය සඳහා වන අතර එය දැනට අමාත්‍යාංශයේ අනිවාර්ය කාර්යයන්ට ඇතුළත් නොවේ. එබැවින්, ඵලදායී, ජවසම්පන්න සහ ඔරොත්තු දෙන කෘෂිකාර්මික අංශයක් පෝෂණය කිරීම සඳහා උපාය මාර්ගික ක්ෂේත්‍ර යටතේ හඳුනාගෙන ඇති මූලික ක්‍රියාකාරකම් ඇතුළත් කරමින් “මෙහෙවර” නැවත සලකා බැලීමට කමිටුව යෝජනා කරයි. ඒ අනුව, කමිටුව විසින් මෙහෙවර පහත පරිදි වෙනස් කිරීමට යෝජනා කරන ලදී.

***තිරසාර, විවිධාංගීකරණය වූ සහ නම්‍යශීලී කෘෂිකාර්මික අංශයකට පහසුකම් සැලසීම, කෘෂිකාර්මික භාවිතයන් නවීකරණය කිරීම, නවෝත්පාදනයන් පෝෂණය කිරීම, සම්පත් සාධාරණ ලෙස බෙදා හැරීම සහතික කිරීම, ස්වභාවික සම්පත් සංරක්ෂණය කරමින් ගොවීන් සවිබල ගැන්වීමට ප්‍රමුඛත්වය දීම අපගේ මෙහෙවර වේ.***

2. කෘෂිකාර්මික අංශයට මගපෙන්වීම සහ මාර්ගෝපදේශන සහතික කිරීම සඳහා ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියක් නොමැති බව කමිටුව නිරීක්ෂණය කරන ලදී. මීට අමතරව, ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල අත්කර ගැනීම අවබෝධ කර ගැනීම සඳහා ඒවා ඒකාබද්ධ කරන හොඳින් සැළසුම් කළ රාමුවක්ද නොමැත. එබැවින් දැනටමත් අනුමැතිය සඳහා ලැයිස්තුගත කර ඇති කෙටුම්පත් කරන ලද කෘෂිකාර්මික ප්‍රතිපත්තිය තුළ පශු සම්පත් සහ කිරි නිෂ්පාදන සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොමැති බැවින් එය නැවත සලකා බැලීමට කමිටුව නිර්දේශ කරයි. තවද, අමාත්‍යාංශයේ නිමැවුම් ව්‍යුහය අවසන් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති පෙළගැස්ම සහ අනෙකුත් අදාළ අංශ අභිබවා යන උපාය මාර්ග සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුය.

3. විවිධ ආයතනවල කාර්යයන් ද්විකරණයවීම වළක්වා ගනිමින් පර්යේෂණ හා සංවර්ධනය සඳහා අඛණ්ඩ මූල්‍ය සහාය ලැබීම කෘෂිකාර්මික අංශයේ ප්‍රගතිය සඳහා දායකවන වැදගත් සාධකයක් බව කමිටුව පිළිගනී. ජාතික වැදගත්කමකින් යුත් පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීමේ අකාර්යක්ෂමතාවයන් සැලකිල්ලට ගනිමින්, සියලුම පාර්ශවකරුවන් විසින් භාවිතා කිරීමට හැකිවන්නා වූත් පහසුවෙන් ප්‍රවේශ විය හැකි සහ නිතිපතා යාවත්කාලීන කළ හැකි වූත් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ විවිධ විෂයයන් ආවරණය වන පරිදි ඩිජිටල් ආකෘතියකින් පර්යේෂණ ගබඩාවක් ස්ථාපිත කිරීම මගින් පර්යේෂණ-ව්‍යාප්ති සබඳතාවය ශක්තිමත් කිරීමට කමිටුව නිර්දේශ කරයි. ජාතික අයවැයෙන් ලබාදෙන ප්‍රතිපාදන තීරණය කිරීමේදී වාර්ෂික පදනමින් කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා පර්යේෂණ වල අනාවරණය කර ගැනීම් දායකත්වය පිළිබඳ විශ්ලේෂණයක් ලබා ගැනීමට කමිටුව නිර්දේශ කරයි.

4. කෘ.උ.වරුන් මගින් සිදුකරන ව්‍යාප්ති සේවා මගින් බිම් මට්ටමේ කෘෂිකාර්මික මෙහෙයුම් වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ ප්‍රතිඵල ගලා නොයන්නේ නම්

පර්යේෂණ සඳහා වෙන් කරන අරමුදල් නාස්තියක් බවට පත්වේ. මධ්‍යම පරිපාලන ක්‍රමය යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට කෘෂිකර්මාන්තයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීමට නියම කර ඇති නමුත් ගොවීන් වෙත තොරතුරු ගලායාම පළාත් සභා යටතේ සේවයේ යෙදෙන කෘ.උ.වරුන් මාර්ගයෙන් සිදුකෙරේ. ජාතික මට්ටමින් සහ පළාත් මට්ටමින් කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන්හි දුර්වල නියෝගකරණය සහ ආංශීකරණය කිරීම; පර්යේෂණ ප්‍රතිඵල ගොවීන් වෙත ඵලදායි ලෙස ප්‍රේෂණය නොවීමට ප්‍රධාන හේතුවක් ලෙස කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. එබැවින් මධ්‍යම රජයෙන් පළාත් ව්‍යුහය සඳහා සෘජු මෙහෙයුම් මාර්ගයක් ස්ථාපිත කිරීමට විසිරුණු ව්‍යාප්ති සේවාවන් එක සෙවනක් යටට ඒකාබද්ධ කිරීම මෙන්ම නවීන සන්නිවේදන තාක්‍ෂණ භාවිතයද; පර්යේෂණවල සිට ගොවීන් දක්වා තොරතුරු සුමට ලෙස ගලායාමට සහ රාජ්‍ය මූල්‍ය වඩා හොඳින් භාවිතා කිරීමට හැකි වන පරිදි පර්යේෂණ සහ ව්‍යාප්ති පද්ධති අතර ශක්තිමත් සම්බන්ධයක් ඇති කරනු නොඅනුමානය.

5. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් කරන ලද නිර්දේශ මත පදනම්ව සකස් කරන ලද පුළුල් තාක්ෂණික ප්‍රවාහයක් වන ශ්‍රී ලංකා කෘෂිකාර්මික යහ පිළිවෙත් (SLGAP) කෘෂිකාර්මික භාණ්ඩ නිෂ්පාදනය සහ නිෂ්පාදන සුරක්ෂිතභාවය ඉහළ නංවනවාට කිසිදු සැකයක් නැත. ගෝලීය GAP සමඟ වඩාත් අනුගතවී ඇති බැවින් ඒවායින් සමහරක් දේශීය තත්වයන් යටතේ සාක්ෂාත් කර ගැනීමට අපහසු වන වත්මන් මාර්ගෝපදේශවල අඩුපාඩු පිළිගනිමින්, සම්පත් අවභාවිතය (පොහොර, ජලය, ආදිය ඇතුළුව) අවම කිරීම සහ කෘෂිකර්මාන්තය සඳහා වන රාජ්‍ය වියදම් අඩු කරගන්නා අතරේදී නිර්දේශිත පිළිවෙත් අනුගමනය කිරීමට ගොවි ප්‍රජාවට හැකිවන පරිදි දේශගුණ සුහුරු GAP (CSGAP) යන මාතෘකාව යටතේ ආරම්භක GAP ක්‍රියාත්මක කිරීමට කමිටුව නිර්දේශ කරයි.

6. ලබා දී ඇති මුදල් ප්‍රදාන/වවුචර සහ ද්‍රව්‍යාධාර අවසාන පරිශීලකයින් විසින් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කරන්නේද යන්න තහවුරු කිරීමට නිසි යාන්ත්‍රණයක් නොමැතිව, එවැනි වැඩසටහන් සඳහා අරමුදල් වෙන් කිරීම පිරිවැය ඵලදායී නොවිය හැකිය. තවද, ප්‍රතිලාභී මට්ටමින් ද්විකරණයක් නොතිබිය හැකි වුවද, ක්‍රියාකාරකම්, වැඩසටහන් වර්ගය, ප්‍රදේශ ආවරණය යනාදී වශයෙන් වැය විෂයවල විවිධ පැතිවලින් ද්විකරණය වීමේ සම්භාවිතාව පවතී. කෙසේ වෙතත්,

එවැනි ද්විකරණයන් පෙන්වාදීම අභියෝගාත්මක ය. එබැවින්, එවැනි වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම මෙන්ම අයවැය මූලයන් අතර ක්‍රියාකාරකම් ද්විකරණය වීම වැළැක්වීම සඳහා ඒකාබද්ධ යාවත්කාලීන දත්ත ගබඩාවක් පවත්වාගෙන යාමටත් එමඟින් ප්‍රශස්ත සම්පත් භාවිතය සහතික කිරීමටත් කමිටුව නිර්දේශ කරයි. තවද, සම්පත් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතයට සහාය වීම සඳහා අරමුදල් ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කිරීමට ශක්තිමත් සත්‍යාපන යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමද නිර්දේශ කරයි.

7. සම්පත්, විශේෂඥතාව සහ නව්‍ය අදහස් ප්‍රයෝජනයට ගැනීම සඳහා පුද්ගලික අංශය සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සහයෝගීතාවය වර්ධනය කිරීම. එවැනි හවුල්කාරිත්වයන් මගින් කාර්යක්ෂමතාව වැඩිදියුණු කළ හැකි අතර තාක්ෂණික ධාරිතාවය සහ මූල්‍යමය වශයෙන් අතිරේක සම්පත් ගෙන එයි.

8. ජාතික අයවැයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන අතරින් විශාලතම කොටස වෙන්කර ඇත්තේ පොහොර සහනාධාරය සඳහා වන බව කමිටුව සඳහන් කළේය. පොහොර සඳහා රජයේ සහනාධාරය වඩාත් අවදානමට ලක්විය හැකි ගොවි ප්‍රජාවන්ට පමණක් ලැබෙන පරිදි සහනාධාර වැඩසටහනේ අවශ්‍යතාවය කමිටුව හඳුනාගෙන එය තාර්කිකරණය කිරීමට නිර්දේශ කරයි. තවද, මානව හා පාරිසරික සෞඛ්‍යය වැඩිදියුණු කරමින් සහ පොහොර සහනාධාරය සඳහා රජයේ වියදම් අවම කරන අතරතුරම, බෝග සඳහා අවශ්‍ය පෝෂ්‍ය පදාර්ථ ලබාදීම සඳහා කෘතිම හා කාබනික පොහොර සංයෝගයක් භාවිතා කරමින් ඒකාබද්ධ ශාක පෝෂණ ක්‍රියාවලිය (IPNS) පිළිබඳ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කමිටුව නිර්දේශ කරයි.

9. වැඩිහිටි ගොවීන් සඳහා වන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ ගොවීන් සඳහා වන දායක රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳව ඉදිරිපත් කර ඇති තොරතුරු ප්‍රමාණවත් නොවන බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. මේ අනුව, ජාතික අයවැයේ ප්‍රතිපාදන යුක්තියුක්ත කිරීම සඳහා පසුගිය වසර තුනක කාලය මත පදනම්ව අදාළ සංඛ්‍යාවන් සහ බෝග ප්‍රදේශය අනුව රක්ෂණාවරණය සැපයීමට කමිටුව නිර්දේශ කරයි. තවද, 'දායකත්ව රක්ෂණ යෝජනා ක්‍රමයට' ගොවි ජනතාවගෙන් දායකත්වයක් නොමැති බව සඳහන් කරන අතරම, ගොවීන් විසින් වාරික දායකත්වයක් ලබාදීම සහතික කරන ලෙස කමිටුව දැඩි ලෙස නිර්දේශ කරයි. යෝජනා ක්‍රමයේ සමාජ වටිනාකම තාර්කීකරණය කිරීම සහ

වැඩි දියුණු කිරීම සඳහා මෙම වාරික ගෙවීම පොහොර සහනාධාරයට හෝ වෙනත් ප්‍රතිපාදනයකට ඇතුලත් කළ හැකිය.

10. අරමුදල් ප්‍රතිපාදනවල වර්ධක ප්‍රතිලාභ සම්බන්ධයෙන් කිසිදු හේතුදැක්වීමක් සිදු කර නොමැති බව කමිටුව නිරීක්ෂණය කර ඇත. එබැවින්, පසුගිය වසරවල ප්‍රතිපාදනවල ප්‍රගතිය සහ ප්‍රතිඵල මෙන්ම ඉල්ලුම් කළ අයවැය අයිතම සඳහා ඉලක්කගත ප්‍රතිලාභ සහ ප්‍රතිලාභීන් සාධාරණීකරණය කිරීම මත පදනම්ව ඉදිරි අයවැය ප්‍රතිපාදන සැලසීම සිදු කළ යුතු බව කමිටුව දැඩි ලෙස නිර්දේශ කරයි.

11. කෘෂිකාර්මික සංවර්ධනය නංවාලමින් ජාතියට වෘත්තීය සේවාවක් ලබාදීම පිණිස කෘෂිකර්ම අමාත්‍යාංශය සහ රේඛීය දෙපාර්තමේන්තු/ නියෝජිතායතනවල සියලුම කාණ්ඩවල කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය (CPD) අත්‍යවශ්‍ය වේ. එබැවින්, කෘෂිකර්මාන්තයේ වෘත්තීයභාවය වැඩි දියුණු කිරීම සඳහා වෙනත් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන, වෘත්තීය සංවිධාන සහ සංවර්ධන හවුල්කරුවන් සමඟ එක්ව එවැනි CPD වැඩසටහන් සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම කමිටුව දැඩි ලෙස නිර්දේශ කරයි.

12. කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා පාරිභෝගිකයාට සාධාරණ මිලක් සහතික කරන අතරම ඔවුන්ගේ ගොවිපල ලාභය සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීමේදී ගොවි ප්‍රජාව වඩාත් ව්‍යවසායී කෘෂිකර්මාන්තයක් වෙත යොමු කිරීම වැදගත් වේ. එබැවින්, ආහාර පද්ධතිය (යෙදවුම් සැපයුමේ සිට පාරිභෝගිකයාගේ පළඟානින් ජනනය වන අපද්‍රව්‍ය කළමනාකරණය දක්වා), අලෙවිකරණය, අගය දාමය සහ අගය එකතු කළ නිෂ්පාදන ආදිය පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම කමිටුව දැඩි ලෙස නිර්දේශ කරයි.

13. අපනයන දිශානතිය සහ ජීවනෝපාය සංවර්ධනය ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය පුනර්ජීවනය කිරීමේ වැදගත් සංරචක වේ. අපනයන කෘෂිකාර්මික භෝග ඉලක්ක කර ගනිමින් සංවර්ධන වැඩසටහන් රැසක් පසුගිය කාලය තුළ ක්‍රියාත්මක කර ඇතත්, ප්‍රධාන වශයෙන් අවධානය යොමු නොවීම සහ අකාර්යක්ෂම සම්බන්ධීකරණය හේතුවෙන් එම වැඩසටහන් අත්කර ගෙන ඇත්තේ සීමිත සාර්ථකත්වයකි. ආහාර

භෝග, අපනයන කෘෂිකාර්මික භෝග, වැවිලි භෝග සහ පශු සම්පත් සහ කුකුල් මස් ඇතුළු කෘෂිකර්ම විෂයය වෙනස් අධිකාරයන් සහිතව විවිධ අමාත්‍යාංශවලට පැවරී ඇති අතර මේ නිසා ඒවා හුදකලා ලෙස ක්‍රියාත්මක වන බව කමිටුවේ අදහස විය. මෙමගින් නවීන සහ වැඩිදියුණු කළ තාක්ෂණයෙන් අපනයනය ඉලක්ක කරගත් ව්‍යවසායී කෘෂිකර්මාන්තය අධෛර්යමත් කර ඇත. එබැවින් අපනයන දිශානතිය සහිත වඩාත් ඒකාබද්ධ, මනා සම්බන්ධීකරණයකින් යුත් ව්‍යවසායී කෘෂිකර්මයක් සඳහා කෘෂිකර්මාන්තය ආශ්‍රිත මෙහෙයුම් සිදු කරන රාජ්‍ය ආයතන එක සෙවනක් යටතට ගෙන ඒමට කමිටුව නිර්දේශ කරයි.

14. ක්‍රමානුකූලව ක්‍රියාත්මක කළ යුතු වඩා ප්‍රඥාවන්ත සහ හිතකර ප්‍රතිසංස්කරණයක් විය හැකි, පාංශු පරීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව පොහොර නිකුත් කිරීමේ යාන්ත්‍රණයක් අවම වශයෙන් දිස්ත්‍රික් මට්ටමින් ආරම්භ කරමින් ක්‍රියාත්මක කිරීමට කමිටුව නිර්දේශ කරයි. පාංශු පරීක්ෂණ සේවා සැපයීමේදී පෞද්ගලික අංශයේ දායකත්වය දිරිමත් කිරීම සඳහා රෙගුලාසි සකස් කිරීම ද කමිටුව නිර්දේශ කරයි. පොහොර සහනාධාර වැඩසටහන ඵලදායී ලෙස විධිමත් කළ හැකි බැවින්, සත්‍ය පොහොර අවශ්‍යතාවය පිළිබඳ වඩාත් නිවැරදි පුරෝකථනයක් සමඟින් මෙම ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කළ යුතුය. ඊට පෙර, පාංශු පරීක්ෂණාගාරවල පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ ප්‍රමාදයන් හේතුවෙන් පාංශු පරීක්ෂණ කාඩ්පත නිකුත් කිරීමේ දුර්වල ඵලදායිතාව පිළිබඳවද අවධානය යොමු කළ යුතුව ඇත.

අයන්තිද සිල්වා මෙය
අධ්‍යක්ෂ ජනරාල්,
ව්‍යාපෘති අධීක්ෂණ හා කළමනාකරණ දෙපාර්තමේන්තුව

සභාපති .......................

| | |
|---|---|
| මහාචාර්ය බුද්ධි මාරඹේ<br>ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කෘෂිකර්ම පීඨය,<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය | සාමාජික<br>........................ |
| කේ.ජී.ඩී.එන්. ජයසිංහ මෙය<br>ප්‍රධාන ගණකාධිකාරි<br>කෘෂිකර්ම අමාත්‍යාංශය | සාමාජික<br>........................ |
| රංජිත් පේජ් මයා<br>නියෝජ්‍ය සභාපති/සමූහ ප්‍රධාන විධායක නිලධාරී<br>කාගිල්ස් (ලංකා) පීඑල්සී | සාමාජික<br>........................ |
| බී.ජී. චමින්ද මයා<br>අධ්‍යක්ෂ<br>ලුම්බිණි තේ කම්හල් | සාමාජික<br>........................ |
| ආචාර්ය ධනුෂ්ක පෙරේරා<br>අධ්‍යක්ෂ,<br>ජාතික අයවැය දෙපාර්තමේන්තුව | ........................<br>කමිටුවේ<br>කැඳවුම්කරු |

**ඇමුණුම 01**

කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා පත් කරන ලද රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව නිලධාරීන්ගෙන්, විද්වතුන්ගෙන්, ව්‍යවසායකයින්ගෙන් සහ පෞද්ගලික අංශයේ නියෝජනයන්ගෙන් සමන්විත වේ.

අයන්ති ද සිල්වා මිය, අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව - සභාපති

කේ.ජී.ඩී.එන්. ජයසිංහ මිය, ප්‍රධාන ගණකාධිකාරී, කෘෂිකර්ම අමාත්‍යාංශය - සාමාජිකා

මහාචාර්ය බුද්ධි මාරඹේ, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය- සාමාජික

රංජිත් පේජ් මහතා, නියෝජ්‍ය සභාපති/ සමූහ ප්‍රධාන විධායක නිලධාරී, කාගිල්ස් (ලංකා) පීඑල්සී - සාමාජික

බී.ජී. චමින්ද මහතා- අධ්‍යක්ෂ, ලුම්බිණි තේ කර්මාන්ත සමූහය - සාමාජික

ආචාර්ය ධනුෂ්ක පෙරේරා – අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කමිටු කැඳවුම්කරු

මීට අමතරව භාණ්ඩ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවල නිලධාරීන්, ආරාධනා ලදුව කමිටුව වෙත සහභාගි විය.

**ඇමුණුම 2**

**රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුවට අදාළ යොමුගත කරුණු**

i. ආයතනයේ මෙහෙවර සහ දැක්ම සමාලෝචනය කර අවශ්‍ය වේනම් ඒවා නැවත සකස් කිරීම.
ii. රේඛීය අමාත්‍යාංශයේ සියලුම වැඩසටහන්/ව්‍යාපෘති/උප ව්‍යාපෘති/ක්‍රියාකාරකම් සමාලෝචනය කර අමාත්‍යාංශයේ අරමුණු, මෙහෙවර සහ දැක්ම සාක්ෂාත් කර ගැනීම උදෙසා එම එක් එක් කාර්යය මඟින් ලද දායකත්වය කෙබඳු ද යන්න හඳුනා ගැනීම.
iii. පවතින අයවැය ඇස්තමේන්තු තුළ දක්නට ඇති ද්වීකරණයන්, නාස්තිය සහ අඩු ප්‍රමුඛතාවයකින් යුත් නොවැදගත් ව්‍යාපෘති හෝ වියදම් හඳුනා ගැනීම.
iv. අමාත්‍යාංශයේ අරමුණු මෙන්ම ජාතික ප්‍රතිපත්ති සාක්ෂාත් කර ගැනීමේ විභවය අනුව සියලුම වැඩසටහන්/ව්‍යාපෘති/උප ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම.
v. අවම වශයෙන් අමාත්‍යාංශය/දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන මූලික ව්‍යාපෘති 3ක්වත් හඳුනා ගැනීම.
vi. එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට එම ආයතන වෙත සාධාරණීකරණය කළ හැකි හේතු හඳුනා ගැනීම.
vii. මූලික ක්‍රියාකාරකම් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා සැළසිය යුතු කාර්යමණ්ඩල අවශ්‍යතා සහ අනෙකුත් පහසුකම් හඳුනා ගැනීම.
viii. හැකි නම් පිරිවැය ධාවකයන්/ ඒකක පිරිවැය සහ පිරිවැය අවම කිරීමේ ක්‍රමවේද හඳුනා ගැනීම.
ix. පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණය මත පදනම්ව එක් එක් ක්‍රියාකාරකම් සඳහා අවම සම්පත් අවශ්‍යතා හඳුනා ගැනීම.
x. ඉලක්ක ළඟා කර ගන්නා අයුරු ඇගයීම සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) හඳුනා ගැනීම.
xi. ආර්ථිකය යථා තත්ත්වයට පත්කිරීම සඳහා ක්‍රියාත්මක කළ හැකි ප්‍රතිසංස්කරණ (කෙටි/මධ්‍ය/දිගු කාලීන) හඳුනා ගැනීම (උදා: රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයන් සඳහා ශක්‍යතාවයක් ඇති ක්ෂේත්‍ර, ව්‍යාපාර ක්‍රියාවලීන් ප්‍රතිනිර්මාණය කිරීම, පිරිවැය අවම කිරීම සඳහා පරිශීලක ගෙවීම් යාන්ත්‍රණ)
xii. වෙනත් කරුණු.

**ඇමුණුම 3**

**සම්මත කරගන්නා ලද ක්‍රියාපිළිවෙත**

සෑම කමිටු රැස්වීමක් අතරතුරදී ම ඉදිරි රැස්වීම්වලදී සිදු කළ යුතු ක්‍රියාවන් පිළිබඳව තීරණ ගන්නා ලද අතර එමඟින් කාර්යයන් අඛණ්ඩව සහ කාලෝචිත ආකාරයකින් ඉටු කිරීම සඳහා රාමුවක් සම්පාදනය කරන ලදී.

දෙපාර්තමේන්තු/ආයතන විශාල සංඛ්‍යාවක් කෘෂිකර්ම අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින බැවින්, රැස්වීම් පැවැත්වීමේ දී සහ තීරණ ගැනීමේ දී උපරිම කාර්යක්ෂමතාවයක් සහතික කිරීම සඳහා කමිටුව විසින් ඔවුන්ව කණ්ඩායම් වශයෙන් කැඳවන ලදී. දැනුවත්භාවයෙන් යුතුව තීරණ ගැනීම සඳහා අදාළ තොරතුරු වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය විටදී ආයතන කිහිපයක් නැවත කැඳවීමට කමිටුව විසින් තීරණය කරන ලදී.

පැහැදිලි කර ගැනීමේ සහ ආයතනවල රාජ්‍ය වියදම් පිළිබඳව සපයා ඇති තොරතුරුවල අර්ථ ව්‍යාකූලත්වයන් වළක්වා ගැනීමේ අරමුණින්, කමිටුව විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයෙහි ප්‍රතිඵල රාමු කෙටුම්පත, අමාත්‍ය මණ්ඩල තීරණ, විදේශ මූල්‍යකරණ ව්‍යාපෘතිවල විදේශාධාර පිළිබඳ සංදේශවල (Aid memo) වැඩිදුර තොරතුරු අවශ්‍ය පරිදි හා අවශ්‍ය අවස්ථාවන්හිදී ඉල්ලා සිටින ලදී.

කමිටු සාමාජිකයින් සහ සහභාගිවන්නන්හට ඉදිරි රැස්වීම් සඳහා ඵලදායී ලෙස සූදානම් වීමට හැකි වන පරිදි රැස්වීම්වල ලිඛිත සටහන් කාලෝචිත ලෙස බෙදා හරින ලදී. කමිටුව විසින් පසුවිපරම් රැස්වීම්වලදී ගන්නා ලද තීරණ නැවත සළකා බැලීම සඳහා ද අවකාශය ලැබෙන බවට සහතික විය.

**ඇමුණුම 4**

**සමාලෝචන ක්‍රමවේදය (4)**

පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් කමිටුව විසින් සිය සමාලෝචන ක්‍රමවේදය සකස් කරන ලදී.

1) තෙරපුම් ක්ෂේත්‍ර (Thrust areas) / දැක්ම හා පවතින සබඳතාවය (20)
   - අ. අරමුණ සහ අපේක්ෂිත ප්‍රතිඵලය
   - ආ. වඩාත්ම සෘජු ප්‍රතිලාභියා (ප්‍රජාව, අතරමැදියා, ආයතනය)
2) වෙනත් වැඩසටහන් සමඟ තිරස් / සිරස් බැඳීම් (20)
   - අ. පවතින තත්ත්වය හේතුවෙන් මතුවන අවශ්‍යතාවය
   - ආ. අභ්‍යන්තර
   - ඇ. ජාතික/ විදේශ වැඩසටහන්
3) මූල්‍යකරණය මත පවත්නා පීඩනය (20)
   - අ. මූල්‍යකරණ ණය / ප්‍රදාන, දේශීය මූල්‍ය, අයවැයෙන් බාහිර / හවුල්කාරිත්ව මූලාශ්‍රය
   - ආ. මෙතෙක් දරන ලද වියදම් සහ බැඳීම්
   - ඇ. අනාගත මූල්‍යකරණ අවශ්‍යතා - හදිසි, ඉදිරි වර්ෂයේ අයවැය, කල් දැමිය හැකි
4) භෞතික ප්‍රගතිය (20)
   - අ. වැඩ නිම කර ඇති මට්ටම (අවසන් අදියර, මැද අදියර, මුල් අදියර, සූදානම් වීම)
   - ආ. අවසාන නිමැවුම ලබා දීමට එකඟ වූ කාලය (මාස 1- 6, මාස 6-12, මාස 12 ට වැඩි)
5) ප්‍රතිපත්තිමය තීරණ (20)
   - අ. පනත
   - ආ. අමාත්‍ය මණ්ඩල තීරණය/RAMP/NOR
   - ඇ. ක්‍රියාකාරකම්/සහයෝගීතා සැලැස්ම

**ඇමුණුම 5**

**1 වගුව. පොහොර සහනාධාර වැඩසටහනට අදාළ ප්‍රතිපාදන**

| # | වැය විෂයය, පිරිවැය සහ ක්‍රියාත්මක ආයතන | වැය විෂයය විස්තරයේ අරමුණ සහ ප්‍රගතිය | නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|---|
| **1** | පොහොර සහනාධාර වැඩසටහන.<br>2023 වර්ෂය<br>**රු බිලියන 33 (කෘෂිකර්ම අමාත්‍යාංශය)** | මෙම වැඩසටහන මඟින් කුඹුරු අක්කර 5කට අඩු ප්‍රමාණයකට හිමිකම් ඇති වී ගොවීන් මිලියන 1.2ක් සඳහා පොහොර සහනාධාරය ලබා දේ.<br>• සහනාධාර පිරිවැය - රු බිලියන 26<br>• මෙහෙයුම් පිරිවැය - රු බිලියන 7 | පොහොර සහනාධාර වැඩසටහන සඳහා වෙන් කරන ලද මුදලින් පහෙන් එකක් (**21%**) එහි මෙහෙයුම් සහ බෙදා හැරීමේ පිරිවැය ලෙස වැය වේ. අලුතින් හඳුන්වා දෙන ලද වවුචර/ මුදල් ප්‍රදාන ක්‍රමවේදය මඟින් මෙහෙයුම් පිරිවැය ලෙස වෙන් කර ඇති මුදලින් සැළකිය යුතු ප්‍රමාණයක් වාර්ෂිකව අයවැයෙන් ඉතිරි කර ගත හැකි බව රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. තවද, මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය සඳහා වෙන් කරන ලද රු. මිලියන 5,000 ක මුදල ඉතිරි කරන ලෙසට කමිටුව නිර්දේශ කරයි. |
| **2** | පොහොර සහනාධාර වැඩසටහන සඳහා වන බැඳීම<br>**රු බිලියන 62.7 (කෘෂිකර්ම අමාත්‍යාංශය)** | • බැඳීම්- **රු බිලියන** 43.6<br>• ණය හා පොළී - **රු බිලියන** 19.1 | පොහොර සහනාධාර ගෙවීම් පිළිබඳ වාර්තා වඩා පැහැදිලි ලෙස ලබා ගැනීම සඳහා දිගුකාලීන බැඳීම් සහ පසුගිය වසරේ බිල්පත් ගෙවීම අයවැය ඇස්තමේන්තුවේ වෙන වෙනම පෙන්වා දියයුතු බව රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| **3** | පොහොර පරීක්ෂණ රසායනාගාරය වැඩිදියුණු කිරීම **රු මිලියන 9**<br>**(**ලංකා පොහොර සමාගම**)** | ලංකා පොහොර සමාගමේ පොහොර පරීක්ෂණ රසායනාගාරයේ අත්‍යවශ්‍ය නවීකරණ කටයුතු සිදු කිරීම සඳහා.<br>• දරන ලද පිරිවැය - **රු මිලියන** 5<br>• වියදම් සඳහා බැඳීම - **රු මිලියන** 11 | ලංකා පොහොර සමාගමේ උපයාගත් මූලයයෙන් විද්‍යාගාර පහසුකම් නඩත්තු කිරීමේ වියදම් ආවරණය කළ හැකි බැවින් මෙම ප්‍රතිපාදන වෙන් කිරීම අඛන්ඩව සිදු කිරීම අනවශ්‍ය බව රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව විසින් පෙන්වා දෙන ලදී.<br>එබැවින්, 2024 වර්ෂය සඳහා මෙම ප්‍රතිපාදන අවශ්‍ය නොවනු ඇත. |
| **4** | පොහොර ගබඩා ඉදි කිරීම<br><br>**රු මිලියන 300 (**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**)** | දැනට පවතින ගබඩා ප්‍රමාණවත් නොවන බැවින් පොහොර ගබඩා කිරීම සඳහා ප්‍රදේශ 19ක ගොඩනැඟිලි 38ක් ඉදිකිරීම සඳහා | අත්‍යාවශ්‍ය කාර්යයන් සහ රජයේ පොහොර බෙදා හැරීමේ ක්‍රමෝපායයේ වාර්තා වී ඇති වෙනස්කම් සලකා බැලීමෙන් අනතුරුව, **2024 වර්ෂයේ දී මෙම ප්‍රතිපාදන වෙන් කිරීම අවශ්‍ය නොවනු ඇත**. |

**2 වගුව. මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති**

| # | වැය විෂයය විස්තරය, පිරිවැය සහ ක්‍රියාත්මක ආයතන | වැය විෂය විස්තරයේ අරමුණ සහ ප්‍රගතිය | නිරීක්ෂණ හා නිර්දේශ |
|---|---|---|---|
| **5** | කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය<br><br>*ඵලදායිතාව සහ නිෂ්පාදනය වැඩි දියුණු කිරීම, වෙළෙඳපොළ තරඟකාරිත්වය හා නිෂ්පාදනය විවිධාංගීකරණය කිරීම*<br><br>**රු මිලියන 16,685**<br><br>**කෘෂිකර්ම අමාත්‍යාංශය** | • දිස්ත්‍රික්ක 12 ක නවීකරණය කරන ලද කෘෂිකාර්මික තාක්ෂණ උද්‍යාන 42 ක් සංවර්ධනය කිරීම (67%)<br>• නිෂ්පාදන සහ වෙළඳපොළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම (44%)<br>• කුඩා වැව් 22ක් (100%), වගා ළිං 148ක් (14.8%), කුඩා පරිමාණ ඇළ මාර්ග 22ක් (82%) ප්‍රතිසංස්කරණය කිරීම<br>• ලෝක බැංකු සංරචකය: 55% යුරෝපා සංගම් සංරචකය : 20% | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දීර්ඝ ප්‍රමාදයන් හේතුවෙන් පූර්ව සැලසුම් කළ ප්‍රතිලාභ අපේක්ෂිත පරිදි ප්‍රජාව වෙත ලැබී නොමැත. තවදුරටත් කාල සීමාව දීර්ඝ කිරීමකින් තොරව, 2024 වර්ෂයේ නියමිත කාල සීමාව වන විට සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම සඳහා ක්‍රමෝපායික මැදිහත්වීම් සිදු කරන ලෙස කමිටුව දැඩි ලෙස නිර්දේශ කර සිටියි. |

| | | | |
|---|---|---|---|
| 6 | **කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩ සටහන**<br><br>*සුළු පරිමාණ ගොවීන්ට වෙළඳපොළ හා මූල්‍ය ප්‍රවේශය වැඩි දියුණු කිරීම*<br><br>**රු මිලියන 17,171**<br><br>**කෘෂිකර්ම අමාත්‍යාංශය** | වාණිජ හවුල්කාරීත්ව 57,500 4ක් සංවර්ධනය කිරීම (රංජ්‍ය, පෞද්ගලික නිෂ්පාදන හා හවුල්කාරීත්වය)<br><br>වාණිජ හවුල්කාරීත්ව (රාජ්‍ය, පෞද්ගලික නිෂ්පාදන හවුල්කාරීත්වය **64%)**<br><br>ගොවීන් සහ ප්‍රවර්ධකයන් 36,870ක් හට ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් සැපයීම. (50%)<br><br>• සමස්ත ප්‍රගතිය : 57% | ව්‍යාපෘතියේ වත්මන් මෙහෙයුම් අරමුණු මුල් අරමුණුවලින් වෙනස් වන අතර, ව්‍යාපෘති දියත් කිරීම ද පසුගිය වසර 6 තුළ සැලසුම්ගත ඉලක්කවලින් බෙහෙවින් අපගමනය වී ඇත. මෙම තත්ත්වය, ප්‍රජාවට ප්‍රතිලාභ ලබාදීම ප්‍රමාද වීමට හේතු වී ඇත. **එබැවින්, 2024 වසර අවසානය වන විට, තවදුරටත් කාලය දීර්ඝ කිරීමකින් තොරව එම ව්‍යාපෘතිය නිම කිරීමට සෑම උත්සාහයක්ම ගන්නා ලෙසට කමිටුව දැඩි ලෙස නිර්දේශ කර සිටියි.** තවදුරටත් ප්‍රමාද වීම් සිදු වුවහොත්, එමඟින් රජයට සැලකිය යුතු මූල්‍ය පාඩුවක් සිදු වනු ඇත. |
| 7 | **දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය**<br><br>**රු මිලියන 18,800**<br><br>**කෘෂිකර්ම අමාත්‍යාංශය** | තිරප්පනේ දේශගුණ සුහුරු කෘෂිකර්ම ගොවිපළේ ක්ෂේත්‍ර පාසල පිහිටුවීම (100%)<br>ගොවිජන සේවා මධ්‍යස්ථාන 47ක් නවීකරණය කිරීම (100%)<br>කුඩා වැව් 487ක් ප්‍රතිසංස්කරණය කිරීම (52%)<br>ගෙවතු 66,096ක් පිහිටුවීම (100%)<br>වගා ළිං 1,260ක් ප්‍රතිසංස්කරණය කිරීම (68%)<br>ධාන්‍ය ගබඩා 20ක් ඉදිකිරීම (55%)<br>• සමස්ත ප්‍රගතිය: 58% | ව්‍යාපෘතියේ ගිවිසුම්ගත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බැවින්, සාක්ෂාත් කර ගත හැකි ඉලක්ක සහිතව ව්‍යාපෘතියේ විෂය පථය අඩු කර ණය අරමුදල් ප්‍රතිඅරමුණුගත කිරීමට තීරණය කරන ලදී. **එබැවින්, ඵලදායි හා සමීප අධීක්ෂණ යාන්ත්‍රණයක් සහිතව, විෂය පථය අඩු කරන ලද සැලැස්ම තුළ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.** |
| 8 | **කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර නගා සිටුවීමේ ව්‍යාපෘතිය**<br><br>**රු මිලියන 14,760**<br><br>**කෘෂිකර්ම අමාත්‍යාංශය** | දිස්ත්‍රික්ක හයක දේශගුණික විපර්යාස හේතුවෙන් බලපෑමට ලක් වූ ග්‍රාමීය කුඩා පරිමාණ කෘෂි නිෂ්පාදකයන්ගේ පවුල් **40,000** ක් නගාසිටුවීම සහ වෙළඳපල සහභාගීත්වය ගොඩනැගීම.<br><br>ජලාශ **260**ක් ප්‍රතිසංස්කරණය කිරීම<br><br>ගොවිජන සේවා මධ්‍යස්ථාන **30**ක් නවීකරණය කිරීම<br>• සමස්ත ප්‍රගතිය: 2.4% | මෙම ව්‍යාපෘතිය, දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම යන කෘෂිකර්ම අමාත්‍යාංශයේ පරමාර්ථයට දැඩිව අනුකූල වී ඇත.<br><br>අනෙකුත් ව්‍යාපෘතිවල ප්‍රමාද වීම් තුළින් නිරීක්ෂණය වූ අහිතකර බලපෑම් සලකාබලා මෙම ව්‍යාපෘතිය නියමිත දිනට සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී. |

| | | | |
|---|---|---|---|
| | | | **එබැවින්, ක්‍රියාත්මක කළ හැකි නිසි කාර්ය සැලැස්මක් සහිතව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලෙසත්, එය සාර්ථකව පවත්වාගෙන යාම සඳහා ඵලදායී හා සමීප අධීක්ෂණ යාන්ත්‍රණයක් ඇති කරන ලෙසත් කමිටුව විසින් දැඩිලෙස නිර්දේශ කරනු ලැබේ.** |
| **9** | කුඩා ප්‍රමාණයේ කිරි නිෂ්පාදන සමුපකාර සමිති සංවර්ධනය<br><br>**රු** මිලියන **3,600** | සමුපකාර සමිති **3**ක් සඳහා කුඩා ප්‍රමාණයේ කිරි සැකසුම් කම්හල් තුනක් ඉදිකිරීම (**97%)**<br><br>මෙම ව්‍යාපෘතිය මඟින් තනි පුද්ගල ව්‍යවසායකයින් තිදෙනෙකු සඳහා කුඩා පරිමාණයේ කිරි සැකසුම් කම්හල් තුනක් ඉදිකර ඇත. (**96%)**<br><br>• සමස්ත ප්‍රගතිය: 70 % | මෙම ව්‍යාපෘතිය; වටිනාකම් දාමය හා අලෙවිකරණය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳ කෘෂිකර්ම අමාත්‍යාංශයේ සමස්ත අරමුණ සමඟ මනා ලෙස අනුකූල වේ.<br>කෙසේ නමුත්, එකඟ වූ පරිදි මුල් ව්‍යාපෘති කාලසීමාව තුළ ව්‍යාපෘතිය අවසන් කර නොමැති බව කමිටුව නිරීක්ෂණය කළ අතර එය අවසන් කිරීම සඳහා තවත් වසර 02 ක කාල සීමා දීර්ඝ කිරීමක් කර තිබේ.<br><br>**එබැවින්, දීර්ඝ කරන ලද කාලසීමාව ඇතුළත ව්‍යාපෘතිය අවසන් කිරීමට යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස කමිටුව විසින් දැඩි ලෙස නිර්දේශ කරනු ලැබේ.** |

| **3 වගුව. බීජ නිෂ්පාදන සහ පැළෑටි සංරක්ෂණ වැඩසටහන්** | | | |
|---|---|---|---|
| # | **වැය විෂයය විස්තරය, වියදම සහ ක්‍රියාත්මක ආයතන** | **අරමුණ හා ප්‍රගතිය** | **නිරීක්ෂණ** |
| **10** | බීජ සහතිකකරණය හා පැළෑටි සංරක්ෂණය<br><br>**රු මිලියන 2,000 (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)** | ගොවීන්ගෙන් බිත්තර වී මිලදී ගැනීම<br><br>සහතිකකර බෙදා හැරීම සඳහා ගොවිපළවලින් සහ කොන්ත්‍රාත් වගාකරුවන් හරහා ගුණාත්මක බීජ නිෂ්පාදනය කිරීම.<br><br>වෙනත් ආහාර බෝග සහතික කිරීම<br><br>**සමස්ත ප්‍රගතිය: 70 %** | **කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ එකඟතාවය ඇතිව බීජ වැඩසටහනෙහි සැලසුම්ගත අරමුණුවලට බාධාවක් නොවන පරිදි රුපියල් මිලියන 500ක් අඩු කිරීමට කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.**<br><br>මෙම ආයෝජනය තුළින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ වාර්තාවක් **කෘෂිකර්ම දෙපාර්තමේන්තුව** විසින් ඉදිරිපත් කළ යුතු අතර එය 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට ප්‍රථම ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් සමාලෝචනය කළ යුතුය. |

**4 වගුව. ආහාර සුරක්ෂිතතා වැඩසටහන්**

| # | **වැය විෂයය විස්තරය, පිරිවැය සහ ක්‍රියාත්මක ආයතන** | **අයවැය රේඛාවේ අරමුණ සහ ප්‍රගතිය** | **නිරීක්ෂණ හා නිර්දේශ** |
|---|---|---|---|
| **11** | ආහාර සුරක්ෂිතතා විශේෂ වැඩසටහන<br><br>රු.මිලියන 900<br>**(කෘෂිකර්ම අමාත්‍යාංශය)** | අක්කර 2,500 ක කෘෂි බෝග වගා කිරීම සඳහා ප්‍රතිලාභීන් 6,000 ක් වෙත පුහුණුව, රෝපණ ද්‍රව්‍ය, බීජ සහ උපකරණ ලබා දීම.<br><br>අක්කර 4,600 ක බඩඉරිඟු නිෂ්පාදනය සහ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සඳහා ගොවීන් 2,500 ක් වෙත මුදල් ආධාර ලබා දීම.<br><br>තාක්ෂණික උපකරණ සහිත ආරක්ෂිත ගෘහ 239ක් සහ සුළු වාරිමාර්ග පද්ධති ස්ථාපනය කිරීම.<br><br>වැසි ආවරණ 12 ක් ස්ථාපනය කිරීම<br><br>ප්‍රශස්ථ කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කරනු ලබන ගම්මානයක් ස්ථාපිත කිරීම.<br><br>පාංශු පරීක්ෂණ කට්ටල 553ක් ප්‍රසම්පාදනය.<br><br>ගොවීන් 70 දෙනෙකු සඳහා වගා ළිං 70ක් ප්‍රතිසංස්කරණය කිරීම.<br><br>පාංශු පරීක්ෂණාගාර 12ක් වැඩිදියුණු කිරීම.<br><br>**සමස්ත ප්‍රගතිය: 30%** | ව්‍යාපෘතියේ ඇතුළත් බොහෝ වියදම් සංරචක පුනරාවර්තන ස්වභාවයක් ඇති නමුත්, ඒවා ප්‍රාග්ධන වැය විෂය යටතේ ලැයිස්තුගත කර ඇති බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.<br>ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී භාවිතා කරනු ලබන නිර්ණායක සහ අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටි විනිවිදභාවයෙන් තොර බව ද කමිටුව නිරීක්ෂණය කර ඇත.<br><br>**එබැවින්, පහත සඳහන් කරුණු කෙරෙහි නිසි අවධානය යොමු කරමින්** 2024 **වර්ෂයේ අයවැය ප්‍රතිපාදන වෙන් කළ යුතු බවට කමිටුව නිර්දේශ කරයි.**<br>- පුනරාවර්තන ස්වභාවයේ වියදම් ප්‍රාග්ධන වැය විෂයන්ගෙන් වෙන් කර දැක්වීම.<br>- වාර්ෂික අයවැය ප්‍රතිපාදන ඉල්ලා සිටීමට පෙර නිසි අනුමැතිය ලබා ගත යුතුය. |
| **12** | සුළු වාරිමාර්ග පද්ධති සහ පුරන් කුඹුරු<br><br>රු.මිලියන 3,000<br>**(**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**)** | පුරන් කුඹුරු වගා කිරීම, පැරණුට් ක්‍රමය භාවිතයෙන් ඵලදායිතාවය වැඩි දියුණු කිරීම, දේශගුණික විපර්යාසවලට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා සුළු වාරිමාර්ගවල ප්‍රධාන අලුත්වැඩියාවන් සහ කුඩා වැව්වල සුළු අලුත්වැඩියාවන් සිදු කිරීම.<br><br>• සමස්ත ප්‍රගතිය: 20% | ජාතික මට්ටමේ ආහාර සුරක්ෂිතතාව සාක්ෂාත් කර ගැනීම කෙරේ මෙම ක්‍රියාකාරකම මඟින් ඇති වන බලපෑම පිළිබඳව සලකා බලන ලදුව, පාරිසරික බලපෑම සහ අනෙකුත් ප්‍රතිඵල සලකා බලා **මෙම ව්‍යාපෘතිය සඳහා අයවැය ප්‍රතිපාදන සලසා දීම නිර්ණය කරනු ලැබේ.** |

| | | | |
|---|---|---|---|
| **13** | අතිරේක බෝග වගා වැඩසටහන<br>බෝග නිෂ්පාදනය<br><br>රු මිලියන 100<br>**(කෘෂිකර්ම අමාත්‍යාංශය)** | අක්කර 7,000ක් ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක 15ක ගොවි පවුල් 15,500කට ධාන්‍ය බෝග; මුං ඇට, කව්පි, උඳු ආදිය නිෂ්පාදනය කිරීම සඳහා ඒ ඒ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරු (දිසාපති) හරහා බීජ ලබා දීම.<br><br>**භෞතික ප්‍රගතිය : 50%**<br>• ගොවි පවුල් වෙත බීජ සැපයීම: 30%<br>• ආවරණය වන ප්‍රදේශය: 32% | **මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම නිර්දේශ කරන අතරම** 2024 **වසර සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමට පෙර මෙම වැඩසටහනේ ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායක සහ ක්‍රියා පටිපාටි ඇතුළුව එහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව**, **වගා වපසරිය සහ නිෂ්පාදනය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස කමිටුව දැඩි ලෙස නිර්දේශ කරයි.** |
| **14** | කෘෂිකර්මාන්තයේ තරුණයින් රඳවා තබා ගැනීම සහ තරුණ පරපුර කෘෂිකර්මාන්තය තුළ ප්‍රධාන ධාරාවට යොමු කිරීම<br><br>රු මිලියන 120<br>**(කෘෂිකර්ම අමාත්‍යාංශය)** | දිස්ත්‍රික්ක 5ක යොවුන් කෘෂි ව්‍යවසායක ගම්මාන ආරම්භ කිරීම.<br><br>කෘෂි යන්ත්‍රෝපකරණ, පුහුණුව හා දැනුවත්භාවය, පශු සම්පත්, රෝපණ ද්‍රව්‍ය හා බීජ, පසු අස්වනු තාක්ෂණය සහ දැනුම ලබා දීම.<br><br>සුළු වාරිමාර්ග සහ ඇළ පද්ධති, කෘෂිකාර්මික මාර්ග ආදිය ප්‍රතිසංස්කරණය කිරීම.<br><br>• වැඩසටහන තවමත් ක්‍රියාත්මක කිරීමේ මූලික අදියරේ පවතී<br><br>**භෞතික ප්‍රගතිය: 60%** | කමිටුව විසින් වැඩසටහනෙහි අන්තර්ගතය පිළිබඳව අවධානය යොමු කරන ලද අතර මූලික කටයුතු පමණක් ආරම්භ කර ඇති බව නිරීක්ෂණය කරන ලදී. **එබැවින්,** 2023 **වසර අවසන් වන විට අත් කරගන්නා ප්‍රගතිය මත පදනම්ව** 2024 **වසර සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.** |

| 5 වගුව. පශු සම්පත් හා කිරි නිෂ්පාදන සංවර්ධනය | | | |
|---|---|---|---|
| # | **වැය විෂයය හා විස්තරය, පිරිවැය සහ ක්‍රියාත්මක ආයතන** | **වැය විෂය විස්තරයේ අරමුණු සහ ප්‍රගතිය** | **නිරීක්ෂණ හා නිර්දේශ** |
| **15** | දියර කිරි පරිභෝජනය සඳහා පහසුකම් සැලසීම සහ ප්‍රවර්ධනය කිරීම<br><br>රු මිලියන 25<br>**(කෘෂිකර්ම අමාත්‍යාංශය)** | පාසල් දරුවන් අතර දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම.<br><br>(**සැ.යු**.: අවම සුදානම හේතුවෙන්, මෙම වැඩසටහන 2023 වර්ෂයේ දී ක්‍රියාත්මක නොවන බව කමිටුව වෙත දන්වා ඇති අතර වෙන් කරන ලද ප්‍රතිපාදන 2022 වසරට අදාළ බැදීම් නිරවුල් කිරීම සඳහා උපයෝජනය කර ඇත). | අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සහයෝගීතාවයෙන් යුතුව පෝෂණ ගැටලු විසඳීමේ වැදගත්කම සැළකිල්ලට ගනිමින්, 2024 වසරේ අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමට පෙර ව්‍යාපෘතිය සඳහා ක්‍රියාත්මක කළ හැකි සැලැස්මක් සකස් කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ. |
| **16** | පශු සම්පත් අභිජනන වැඩසටහන<br><br>රු මිලියන 200<br>**(**සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**)** | විශේෂයෙන් ආනයනය හරහා ඖෂධ, එන්නත්, හා ශුක්‍රාණු ආදී අභිජනනයට අවශ්‍ය යෙදවුම් සපයා දීම මඟින් ජානමය වශයෙන් වැඩිදියුණු කළ පශු සම්පත් වර්ධනය කිරීම.<br><br>• ප්‍රගතිය: 40 % | කෘත්‍රිම සිංචන (AI) වැඩසටහනේ සාර්ථකත්වය 40%ක් පමණ වන බව කමිටුව වෙත දැනුම් දී ඇත.<br><br>**මෙම වැඩසටහන වඩාත් ඵලදායී බවට පත් කිරීම සඳහා අනාගත කෘත්‍රිම සිංචන කාර්යයන්හි දී පුද්ගලික අංශය සමඟ හවුල්කාරිත්වයකට එළඹීම සුදුසු බවට රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.** |
| **17** | කුණ්ඩසාලේ **කෘත්‍රිම සිංචන** අභිජනන මධ්‍යස්ථානයේ වැඩිදියුණු අභිජනන පහසුකම් තුළින් දියර කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම.<br><br>රු මිලියන 100 (අයවැය යෝජනාවකි.)<br><br>සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | ශුක්‍රාණු නිෂ්පාදනය සඳහා ශුක්‍ර දායක ගවයින් ආනයනය කිරීම.<br><br>පිරිවැය 70% කින් පමණ වැඩි වී ඇති බැවින් මෙම වැඩසටහන තවමත් මුල් ප්‍රසම්පාදන මට්ටමේ පවතී.<br><br>• **සමස්ත ප්‍රගතිය:** 10% | වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙම අයවැය යෝජනාව ක්‍රියාත්මක කිරීම ප්‍රසම්පාදන අදියරේදී අත්හිටුවා ඇති බව කමිටුවේ අවධානයට යොමු විය.<br><br>**එබැවින්, මෙම කාර්යය සඳහා මෙම වසරේ (2023) ක්‍රියාත්මක නොවන "සත්ව අභිජනන ගොවිපල වැඩසටහන" (අයිතම අංක 16) වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් සහ ඉතිරි ප්‍රතිපාදන "පශු සම්පත් අභිජනන වැඩසටහන" (අයිතම අංක 18) වෙතින් ලබා ගැනීමට කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.** |

| | | | |
|---|---|---|---|
| **18** | **සත්ව අභිජනන ගොවිපල පිහිටුවීම**<br><br>රු.මිලියන 50.<br>**(කෘෂිකර්ම අමාත්‍යාංශය)** | අභිජනන පහසුකම් වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම.<br><br>**භෞතික ප්‍රගතිය**: 30% | 2022 වසරේ බැඳීම් පියවීම සඳහා රු. මිලියන 15ක් පමණ අවශ්‍ය වන බව වෙත අනාවරණය විය.<br>**එබැවින්, එම මුදල නිරවුල් කරන ලෙසත්, උසස් තත්වයේ ශුක්‍රාණු නිශ්පාදනය සඳහා මෙහෙයුම් වියදම්හි පවත්නා මූල්‍ය පරතරය (අයිතම අංක 17) පියවීම සඳහා වියදම් දැරීම වෙනුවෙන් ඉතිරි ප්‍රතිපාදන කුණ්ඩසාලේ අභිජනන මධ්‍යස්ථානය වෙත මාරු කරන ලෙසත් කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.** |
| **19** | කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය<br><br>රු.මිලියන 225<br>**(කෘෂිකර්ම අමාත්‍යාංශය)** | • ගොවීන් සහ රජයේ සමාන දායකත්වයක් සහිතව (ඌරන්, කුකුළු, ගව ඇතුළු ක්ෂේත්‍රව පශු සම්පත් සංවර්ධනය වෙනුවෙන් සංක්‍රාම/ සහනාධාර ලබාදීම<br>• **භෞතික ප්‍රගතිය**: 20% | සමස්ත ප්‍රතිපාදනවලින් 60% ක් පූර්ව වර්ෂයේ (2022) බැඳීම්වලින් සමන්විත බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.<br><br>**ඉදිරි සැලැස්ම මත පදනම්ව**, **ව්‍යාපෘතියට අදාළ පේදුරුතුඩුව ප්‍රෙද්ශයේ ඉදිකිරීම කල් දමා 2023 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් එකී කාර්යය සඳහා රු. මිලියන 25ක් අඩු කරන මෙන් කමිටුව නිර්දේශ කරයි.** |
| **20** | එළු පාලනය<br><br>රු.මිලියන 150<br>**(කෘෂිකර්ම අමාත්‍යාංශය)** | දිස්ත්‍රික්ක 19ක තෝරාගත් ගොවි පවුල් 1,921කට එළු පැටවුන් ලබාදීම<br><br>• සමස්ත ප්‍රගතිය: 100% | මෙම ව්‍යාපෘතිය සඳහා සාර්ථක සැලැස්මක් අවශ්‍ය වන බැවින්**, 2023 වසරේ දී නියමු වැඩසටහනක් දියත් කර**, **එහි සාර්ථකත්වය මත පදනම්ව 2023 වසරේදී වඩා පුළුල් කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.** |
| **21** | පාද සහ මුඛ රෝගය සඳහා දේශීයව එන්නත් නිපදවීම<br><br>රු.මිලියන 126.5<br>**(**සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**)** | පාද සහ මුඛ රෝගයට එරෙහිව දේශීය එන්නත් නිෂ්පාදනය (වසරකට මාත්‍රා 500,000) වැඩි කිරීම.<br><br>සමස්ත ප්‍රගතිය:30 %<br>(සැ.යු.: මෙම ප්‍රතිපාදනයට, ප්‍රසම්පාදිත යන්ත්‍රයක් සඳහා සිදු කරන ලද රු මිලියන 56.5 ක බිල්පත් ගෙවීමක් ඇතුළත් වේ).<br><br>**භෞතික ප්‍රගතිය**: 50% | එකී ප්‍රසම්පාදිත යන්ත්‍රය සඳහා බිල්පත් ගෙවීම 2022 වසරේ දී සිදු කර ඇති බව කමිටුව වෙත දැනුම් දෙන ලදී.<br><br>**එබැවින්, 2023 වසරේ ප්‍රතිපාදන වලින් රු. මිලියන 56.5 ක් අඩු කර වැඩසටහන ක්‍රියාත්මක කරන ලෙස කමිටුව නිර්දේශ කරයි.**<br><br>**මනා සාධාරණීකරණයක් සහිතව සත්‍ය අවශ්‍යතාවය මත පදනම්ව 2024 අයවැය ප්‍රතිපාදන වෙන් කළ යුතු බව ද කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.** |

| | | | |
|---|---|---|---|
| **22** | උසස් තත්ත්වයේ වැස්සි පැටවුන් ලබා ගැනීමේ හැකියාව<br><br>රු මිලියන 71<br>**(සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව)** | කුඩා පරිමාණ ගොවිපලවල තෝරාගත් වැස්සි පැටවුන් හට මාස 3 ක කාලයක් සඳහා ඔවුන්ගේ සරු බව වැඩි කිරීමට සහ වැඩි කිරි නිෂ්පාදනයක් සහතික කිරීම සඳහා සත්ත්ව ආහාර සැපයීම (ඉලක්කගත සත්ව සංඛ්‍යාව - 7,800).<br><br>කුඩා පරිමාණ ගොවීන් සඳහා වැස්සි පැටවුන් රැකබලා ගැනීම පිළිබඳ පුහුණුවක් ලබාදීම.<br><br>• **භෞතික ප්‍රගතිය**: 40 % | වෙළෙඳපොළේ සත්ත්ව ආහාර මිල ඉහළ යාම හේතුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝජනය තුළින් ඉලක්කගත වැස්සි පැටවුන් සංඛ්‍යාව පෝෂණය කළ නොහැකි බව කමිටුව වෙත දැනුම් දෙන ලදී.<br>**එබැවින්**, 2024 **වර්ෂය සඳහා සංශෝධිත මූල්‍ය සැලැස්ම සමඟින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත 'උසස් තත්ත්වයේ වැස්සි පැටවුන් රැකබලා ගැනීම' පිළිබඳ ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලෙසට කමිටුව නිර්දේශ කරයි.**<br>**මේ අනුව**, 2023 **වසරේ ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන** 60**ක් අඩු කිරීමට නිර්දේශ කරනු ලැබේ.** |

| **6 වගුව. විශ්‍රාම වැටුප් සහ රක්ෂණාවරණ** | | | |
|---|---|---|---|
| **#** | **වැය විෂයය විස්තරය, පිරිවැය සහ ක්‍රියාත්මක ආයතන** | **වැය විෂයය විස්තරයේ අරමුණු සහ ප්‍රගතිය** | **නිරීක්ෂණ හා නිර්දේශ** |
| **23** | වයස්ගත ගොවීන් සඳහා දායකත්ව විශ්‍රාම වැටුප්<br><br>රු මිලියන 4,750<br>**(කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය)** | ගොවීන් හා ධීවරයින් 172,000කට විශ්‍රාම වැටුප් ලබාදීම | වයස්ගත ගොවීන්ගේ සහ ධීවරයින්ගේ ආදායම් සුරක්ෂිතභාවය සහතික කිරීම පිණිස විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා දැනට වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය කමිටුව විසින් හඳුනා ගන්නා ලදී. |
| **24** | ගොවීන් සඳහා දායකත්ව රක්ෂණාවරණ ක්‍රමයක් හඳුන්වා දීම<br><br>රු මිලියන 1,000<br>**(කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය)** | ආපදාවකදී තෝරාගත් බෝග සඳහා හානිපූර්ණ අයකර ගැනීමට මූල්‍යාධාර ලබා දීම.<br><br>• **ප්‍රගතිය:** ගොවීන් 6,806ක් වෙත, බෝග 06කට අදාළව අක්කරයකට රුපියල් 40,000 බැගින් රක්ෂණාවරණයක් ලබා දී ඇත. | යෝජිත ක්‍රියාකාරකමෙහි වැදගත්කම රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව හඳුනා ගෙන ඇත.<br><br>මෙම කාර්යය සම්බන්ධයෙන් ගොවීන්ගේ දායකත්වයක් නොමැති බැවින් මෙම වැඩසටහන පිළිබඳව නැවත සලකා බලන ලෙස කමිටුව නිර්දේශ කරයි. පොහොර සහනාධාර වැඩසටහන හා සම්බන්ධ වීමේ හැකියාව සොයා බලන ලෙස ද කමිටුව විසින් නිර්දේශ කරන ලදී. |

| 7 වගුව. පර්යේෂණ සහ සංවර්ධනය | | | |
|---|---|---|---|
| **#** | **වැය විෂයය විස්තරය, පිරිවැය සහ ක්‍රියාත්මක ආයතන** | **වැය විෂය විස්තරයේ අරමුණු සහ ප්‍රගතිය** | **නිරීක්ෂණ හා නිර්දේශ** |
| **25** | ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම (NARP) විශ්වවිද්‍යාල සමඟ ඒකාබද්ධව දියත් කිරීම.<br><br>රු මිලියන 20<br>**(කෘෂිකර්ම අමාත්‍යාංශය)** | කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සමඟ සහයෝගයෙන් කෘෂිකාර්මික සංවර්ධන ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතු සිදු කිරීම සඳහා විශ්වවිද්‍යාල වෙත පර්යේෂණ ප්‍රදාන ලබා දීම.<br>ප්‍රගතිය:<br>• සැලසුම් කරන ලද පර්යේෂණ සංඛ්‍යාව: 10<br>• ජූනි මස තෙක් සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව: 2<br>• දැනට සිදු කෙරෙමින් පවතින සංඛ්‍යාව: 8<br>• මේ දක්වා අරමුදල් උපයෝජනය: රු මිලියන 5.123. | **2024 අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමට ප්‍රථම පර්යේෂණවලින් අනාවරණය කරගත් කරුණු අදාළ කරගැනීම සහ ප්‍රතිපත්ති සම්පාදනයේදී හා ක්‍රමෝපාය වැඩිදියුණු කිරීමේදී ඒවායේ අදාළත්වය සමාලෝචනය කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.** |
| **26** | හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය (HARTI)<br><br>ශ්‍රීලංරු මිලියන 25<br>**(කෘෂිකර්ම අමාත්‍යාංශය)** | පර්යේෂණ සහ ප්‍රකාශන.<br>**පර්යේෂණ ප්‍රගතිය:**<br>• සැලසුම් කරන ලද පර්යේෂණ සංඛ්‍යාව: 10<br>• ජූනි මස තෙක් සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව: 0<br>• දැනට සිදු කෙරෙමින් පවතින සංඛ්‍යාව: 10<br>මේ දක්වා අරමුදල් උපයෝජනය: ශ්‍රීලංරු මිලියන 6.45.<br>• අරමුදල් උපයෝජනය: ශ්‍රීලංරු මිලියන 3.5<br>• **භෞතික ප්‍රගතිය**: 20% | **මාධ්‍ය කටයුතු සඳහා පිරිවැය අවම කිරීමට සහ සියලුම පාර්ශ්වකරුවන්ට පර්යේෂණ කරුණු වෙත පුළුල් ප්‍රවේශයක් ලබා දීමට මාර්ගගත මූලාශ්‍ර හරහා පර්යේෂණවලින් අනාවරණය කරගත් කරුණු ප්‍රකාශයට පත් කරන ලෙස කමිටුව නිර්දේශ කරයි.**<br><br>**2023 අයවැය ඇස්තමේන්තුවෙන් රුපියල් මිලියන 3ක් අඩු කිරීමට කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.** |
| **27** | ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති කවුන්සිලය (SLCARP)<br><br>රු මිලියන 25<br>**(කෘෂිකර්ම අමාත්‍යාංශය)** | ඵලදායිතා වැඩිදියුණු කිරීමේ ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතු සඳහා සෘජු අරමුදල් සැපයීම<br>ප්‍රගතිය:<br>• සැලසුම් කරන ලද පර්යේෂණ සංඛ්‍යාව: 4<br>• ජූනි මස තෙක් සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව: 0<br>• දැනට සිදු කෙරෙමින් පවතින සංඛ්‍යාව: 4<br>• මේ දක්වා අරමුදල් උපයෝජනය: 2023 වර්ෂය සඳහා තවමත් අරමුදල් ලැබී නොමැත. | NARP සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා SLCARP ආයතනය විසින් පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණ කාර්යභාරයක් ඉටු කළ යුතු බව කමිටුව හඳුනාගෙන ඇත.<br><br>**එබැවින්, එම කාර්යය සඳහා පමණක් ප්‍රතිපාදන වෙන් කරන ලෙසත්,** SLCARP **ආයතනය විසින් ලබා දී ඇති සාධාරණීකරණය මත පදනම්ව** 2023 **වර්ෂයේ අයවැය ප්‍රතිපාදන වලින් රු. මිලියන** 15 **ක් අඩු කරන ලෙසත් කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.** |

| | | | |
|---|---|---|---|
| **28** | ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනය<br><br>රු.මිලියන 30 | පසු අස්වනු හානි සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතු සිදු කිරීම.<br><br>රසායනාගාර උපකරණ මිලදී ගැනීම.<br>ප්‍රගතිය:<br>• සැලසුම් කරන ලද පර්යේෂණ සංඛ්‍යාව: 22<br>• ජූනි මස තෙක් සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව: 0<br>• දැනට සිදු කෙරෙමින් පවතින සංඛ්‍යාව: 11<br>• මේ දක්වා අරමුදල් උපයෝජනය: 0 | හානියට ලක්විය හැකි කෘෂිකාර්මික නිෂ්පාදනවල පසු අස්වනු හානි අවම කිරීමේ වැදගත්කම කමිටුව විසින් හඳුනා ගන්නා ලදී. **එබැවින්**, 2024 **අයවැය ප්‍රතිපාදන සඳහා පදනමක් ලෙස**, 2023 **වසරේ ප්‍රතිපාදන උපයෝජනය කරනු ලබන බෝග කාණ්ඩ අනුව පසු අස්වනු හානි ප්‍රමාණාත්මකව අවම කිරීම පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ලබා ගන්නා ලෙස රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.** |
| **29** | **කෘෂිකාර්මික පර්යේෂණ සහ සංවර්ධනය**<br><br>රු.මිලියන 209.5<br>**(කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)** | • නව දෙමුහුන් සහ විවෘතව/ ස්වභාවිකව පරාගණය වන ආහාර බෝග වර්ග වැඩි දියුණු කිරීම<br><br>• ආහාර බෝග සඳහා හරිත තාක්ෂණික වැඩිදියුණු කිරීම් තුළින් දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව අත් කර ගැනීම<br><br>• ආහාර බෝග නිෂ්පාදනය සඳහා පාරිසරික වශයෙන් හිතකාමී තිරසාර තාක්ෂණයන් සංවර්ධනය කිරීම<br><br>• පාංශු සංරක්ෂණ පනත ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම<br><br>• NARP සැලැස්ම යටතේ ඇති ව්‍යාපෘති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම<br><br>සමස්ත ප්‍රගතිය: 58% | පර්යේෂණ හා සංවර්ධනයේ ඇති වැදගත්කම පිළිබඳව කමිටුව හඳුනාගෙන ඇති අතර, එහි ප්‍රතිඵල ප්‍රතිපත්ති සැකසීමේදී හා ඒවා ක්‍රියාත්මක කිරීමේදීත්, මෙම අංශය වෙත නව්‍ය තාක්ෂණයන් හුරුකරවීමටත්, මානව සම්පත් සංවර්ධනයටත් ඉවහල් වේ. එහෙයින්, කමිටුව විසින් ප්‍රතිපාදන වෙන් කිරීම නිර්දේශ කරනු ලබන නමුත් 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන තීරණය කිරීමේදී, 2023 වසර සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් ලද ප්‍රතිඵල පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කිරීමේ වැදගත්කම අවධාරණය කර සිටියි. |

| | | | |
|---|---|---|---|
| **30** | කෘෂිකාර්මික ව්‍යාප්තිය සහ පුහුණුව, යටිතල පහසුකම් සංවර්ධනය, සහ පර්යේෂණ හා සංවර්ධනය<br><br>රු මිලියන 421<br><br>**(කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)** | කෘෂිකාර්මික තාක්ෂණය ගොවි ප්‍රජාව වෙත ව්‍යාප්ත කිරීමට පහසුකම් සැලසීම සහ ආහාර බෝග ආශ්‍රිත වගා කිරීමේ ප්‍රශස්ථ පිළිවෙත් අනුගමනය කිරීම සඳහා ගොවීන්ට සහාය වීම.<br><br>සමස්ත ප්‍රගතිය: 60% | කෘෂිකාර්මික තාක්ෂණයන් සහතික කිරීම සඳහා කෘෂිකාර්මික ව්‍යාප්තිය සහ සන්නිවේදනය එහි අවසාන පරිශීලකයින් වෙත නියමිත කාලයට සහ ඵලදායී ලෙස යොමු කිරීමේ වැදගත්කම කමිටුව හඳුනාගෙන ඇත. එමඟින්, ප්‍රතිපත්ති සම්පාදනය, ඒවා ක්‍රියාත්මක කිරීම, ක්ෂේත්‍රයට නව්‍ය තාක්ෂණයන් හුරු කරවීම මෙන්ම මානව සම්පත් සංවර්ධනය උපකාරී වනු ඇත. එබැවින්, කමිටුව විසින් ප්‍රතිපාදන ලබා දීම නිර්දේශ කරනු ලබන නමුත්, 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම තීරණය කිරීමේදී 2023 වසර සඳහා ප්‍රතිපාදනවල කාර්යසාධනය පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කිරීමේ වැදගත්කම අවධාරණය කෙරේ. |
| **31** | පර්යේෂණ හා සංවර්ධන (ගොවිජන)<br><br>රු මිලියන 50<br>**(කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)** | සුළු වාරිමාර්ග යටතේ පහත සඳහන් ක්ෂේත්‍රවල පර්යේෂණ සිදු කිරීම.<br>- නව්‍ය ක්‍රමවේද ඔස්සේ පිටවාන් සැලසුම් කිරීම<br>- අධි ඝනත්ව පොලිඑතිලීන් ද්‍රව්‍ය භාවිතයෙන් ඉරිගල් වැටි (Rip-Rap) තැනීම<br>- සංවේදක පාදක කරගත් සුළු වාරිමාර්ග | කෘෂිකාර්මික අංශය ආශ්‍රිත පර්යේෂණ සහ සංවර්ධනය පිළිබඳ වැදගත්කම හඳුනා ගනිමින්,වෙන් කරන ලද ප්‍රතිපාදන සංශෝධනය නොකරමින් පර්යේෂණවලින් අනාවරණය කරගන්නා කරුණු සහ ඉදිරි සංවර්ධන සැලසුම් මත පදනම්ව 2024 වසරේදී ප්‍රතිපාදන වෙන් කිරීමට කමිටුව නිර්දේශ කරයි. |
| **32** | පසු අස්වනු හානි අවම කිරීම සහ ගබඩා කිරීම වැඩි දියුණු කිරීම<br><br>රු මිලියන 150<br>**(කෘෂිකර්ම අමාත්‍යාංශය)** | පසු අස්වනු හානි අවම කිරීම:<br>- බඩ ඉරිඟු, වී, ධාන්‍ය වර්ග ආදිය සඳහා ගොවිපළ තුළ ගබඩා පහසුකම් සංවර්ධනය කිරීම.<br>- ආහාර සැකසුම් තාක්ෂණය ව්‍යාප්ත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම,<br>- අගය එකතු කරමින් නිස්සාරණය කරන ලද නිෂ්පාදන වැඩිදියුණු කිරීම ආදී වශයෙනි.<br><br>සමස්ත ප්‍රගතිය: 20% | සැලසුම් කළ පරිදි වැඩසටහන් ක්‍රියාත්මක නොවූ බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.<br><br>**මෙය අයවැය යෝජනාවක් වන බැවින්, එය 2023 වසර තුළ අවසන් කිරීමට කටයුතු කරන ලෙස කමිටුව විසින් නිර්දේශ කෙරේ.** |

| 8 වගුව. ආයතනික සංවර්ධනය | | | |
|---|---|---|---|
| **#** | **වැය විෂයය, පිරිවැය සහ ක්‍රියාත්මක ආයතන** | **වැය විෂය විස්තරයේ අරමුණු සහ ප්‍රගතිය** | **නිරීක්ෂණ හා නිර්දේශ** |
| **33** | **වී අලෙවි මණ්ඩලය**<br><br>**රු මිලියන 300** | **ණය සේවාකරණය සඳහා මූල්‍යාධාර සැපයීම**<br><br>**ආහාරවල ස්වයංපෝෂිත බව ඇති කිරීම සඳහා වී ගබඩා කිරීමට අදාළ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම.**<br><br>**මේ දක්වා කිසිදු භෞතික ප්‍රගතියක් නොමැත.** | **ණය සේවා සංරචක සඳහා කමිටුව එකඟ වූ අතර හදිසි අවශ්‍යතාවයන්ට පමණක් සීමා වන ලෙසත්, දැනටමත් ආරම්භ කර ඇති වී මිලදී ගැනීමේ වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාමට සහාය වෙමින් වී ගබඩා ප්‍රතිසංස්කරණය සඳහා වන වියදම් ක්‍රමානුකූලව ඉවත් කරන ලෙසත් යෝජනා කරන ලදී. තවද, 2023 වසරේ ප්‍රතිපාදන වලින් රු. මිලියන 100ක් අඩු කර වී අලෙවි මණ්ඩලය විසින් සපයන ලද ගබඩා ප්‍රතිසංස්කරණ ක්‍රමානුකූලව නැවැත්වීමේ සැලැස්ම මත පදනම්ව 2024 වසරේ ප්‍රතිපාදන ලබා දෙන ලෙස කමිටුව විසින් නිර්දේශ කරනු ලැබේ.** |
| **34** | ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය **(NFPB)**<br>**රු මිලියන 5**<br>(**කෘෂිකර්ම අමාත්‍යාංශය**) | **ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය හට මෙම වැඩසටහන** සාධාරණීකරණය කිරීමට නොහැකි විය<br><br>**භෞතික ප්‍රගතිය: 0%** | **2023 වසර සඳහා වන සමස්ත ප්‍රතිපාදන අඩු කර ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලයේ කාර්යභාරයට අදාළ සාධාරණීකරණය කළ හැකි සැලැස්මක් මත පදනම්ව 2024 වසර සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට කමිටුව නිර්දේශ කරයි.** |
| **35** | ජාතික කෘෂිකාර්මික විවිධාංගීකරණ සහ ජනාවාස අධිකාරිය - හදබිම අධිකාරිය<br><br>**රු මිලියන 200**<br>**(කෘෂිකර්ම අමාත්‍යාංශය)** | ගොවිතැන ප්‍රවර්ධනය කිරීම පිණිස පාංශු සංරක්ෂණය ගොවීන් හට වෙළඳපල ප්‍රවේශය ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම.<br><br>**භෞතික ප්‍රගතිය**: 40 % | ආයතනයේ කාර්යයන් එක් විශේෂිත ක්ෂේත්‍රයකට පමණක් සීමා වී ඇති බව කමිටුව නිරීක්ෂණය කරයි.<br><br>**අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමේ දී 2024 වර්ෂය තුළ හදබිම අධිකාරියේ අනිවාර්ය කාර්යභාරයන් සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙන ලෙසට කමිටුව නිර්දේශ කරයි.** |

| | | | |
|---|---|---|---|
| **36** | ජාතික පොහොර ලේකම් කාර්යාලයේ (NFS) දිස්ත්‍රික් කාර්යාල වැඩිදියුණු කිරීම<br><br>**රු මිලියන 20**<br>**(**ජාතික පොහොර ලේකම් කාර්යාලය**)** | • දැනට පවතින දිස්ත්‍රික් කාර්යාල ගෘහභාණ්ඩ සහිතව ප්‍රතිසංස්කරණය කිරීම.<br><br>• ජාතික පොහොර ලේකම් කාර්යාලය සඳහා දත්ත පද්ධතියක් සංවර්ධනය කිරීම.<br><br>• දැනටමත් සකස් කොට ඇති දත්ත පද්ධතිය (cloud-based data system) හරහා බිල්පත් ගෙවීම සඳහා පහසුකම් සැලසීම.<br><br>**භෞතික ප්‍රගතිය**: 85% | පොහොර පිළිබඳ නිවැරදිව සැලසුම් කිරීමට සහ වියදම් පිළිබඳ පුරෝකථනය කිරීම සඳහා පොහොර සැපයීම සහ බෙදාහැරීම පිළිබඳ දත්ත ජාලයක් තිබීම දැඩි අවශ්‍යතාවක්ව පවතින බව කමිටුව හඳුනාගෙන ඇත.<br><br>**ඉදිරි පොහොර භාවිතයෙන් සැලසුම්කරණයේ දී එම ක්‍රමය ප්‍රයෝජනයට ගැනීමට බලධාරීන් වග බලා ගත යුතු බව කමිටුව නිර්දේශ කරයි. 2023 වර්ෂයේ දී බිල්පත් ගෙවීම් කළ හැකි නම් අනාගතයේදී මෙම ප්‍රතිපාදන අවශ්‍ය නොවනු ඇති බව රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.** |
| **37** | ගොඩනැඟිලි හා ව්‍යුහයන්<br><br>**රු මිලියන 850**<br>**(**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**)** | • දිස්ත්‍රික් කාර්යාල/ගොවිජන සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම<br><br>• දිස්ත්‍රික් කාර්යාල/ප්‍රධාන කාර්යාලය ප්‍රතිසංස්කරණය කිරීම<br><br>• ගොවිජන සේවා මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම<br><br>සමස්ත ප්‍රගතිය: 0.35% | **නව ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳ රජයේ ප්‍රතිපත්ති සලකා බැලීමෙන් අනතුරුව, මෙම ක්‍රියාකාරකම් දෙක (දිස්ත්‍රික් කාර්යාල සහ ගොවිජන සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම) කල් දැමීමෙන් 2023 අයවැයෙන් මිලියන 250ක් ඉතිරි කරන ලෙස කමිටුව නිර්දේශ කරයි.** |
| **38** | පිරියත හා යන්ත්‍රෝපකරණ<br><br>**රු මිලියන 101**<br>**(**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**)** | • නව උපකරණ මිලදී ගැනීම<br><br>• දැනට පවතින උපකරණ පුනරුත්ථාපනය කිරීම<br><br>සමස්ත ප්‍රගතිය: 30% | **නව ප්‍රසම්පාදන කල් දැමිය හැකි බව කමිටුව විසින් නිරීක්ෂණය කරන ලද අතර එබැවින්, 2023 වසරේ ප්‍රතිපාදනයෙන් රුපියල් මිලියන 30ක් අඩු කර පුනරුත්ථාපන හා නඩත්තු කටයුතු අඛණ්ඩව කරගෙන යන ලෙස කමිටුව විසින් නිර්දේශ කෙරේ.** |